2019.04.09 වන දින රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානි නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානි නියෝජ්‍ය පොලිස්පති රවි සෙනෙවිරත්න මහතා වෙත පිටපතක් සහිතව ගරු පොලිස්පතිතුමා වෙත යොමු කරන ලද "අති රහසයි" යනුවෙන් සඳහන් [illegible] සම්බන්ධයෙන් නිසි පරිදි විමර්ශනය නොකිරීම හේතුවෙන් 2019.04.21 වන දින පාස්කු ප්‍රහාරය [illegible] එමගින් දෙස් විදෙස් පුද්ගලයින් [illegible] දෙස් විදෙස් පුද්ගලයින් —දෙනෙකු බරපතල තුවාල ලැබීම සම්බන්ධයෙන් වූ පැමිණිලි විමර්ශ[illegible] කටයුතු පොලිස්පතිතුමාගේ නියෝග පරිදි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 125 වන වගන්තිය ප්‍රකාරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන බව ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීම.

H 027655 – 10.000 (2006/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

පොලිස් } [illegible]

(P2 Orig. & Dup. Si & T.) 05/89

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.
මිනිමැරුම් විමර්ශන අංශය.

ශ්‍රී ලංකා පොලිසිය/இலங்கைப் பொலிஸ்

## මහේස්ත්‍රාත්වරයා වෙත සැපයෙන තොරතුරු
## நீதிவானுக்கு வழங்கப்படும் தகவல்

පො. පො. පිටුව / த. ப. பக்கம் } C 298/24/ CM

පො. පො. ඡේදය / த. ப. பந்தி }

ස්ථාන අංකය : අ. වැ. ලේ. / நிலைய இல. : குற்றம் சாட்டத்தக்க குற்றப் பதிவேடு }

අ. නො. වෙ. වැ. ලේ. / குற்றமேற்றத்தகாத மற்றைய குற்றங்களின் பதிவேடு }

අධිකරණය / நீதிமன்றம் } කොටුව මහේස්ත්‍රාත්

නඩුවේ අංකය / வழக்கு இல. }

**1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XI වැනි පරිච්ඡේදයේ**
**115 (1), (2), (3), (4), 120 (1), (2), (3) වැනි වගන්ති යටතේ**
**වරදක් විමර්ශනය කිරීමේ වාර්තාව**

**தண்டனைச் சட்டக் கோவை பற்றி தேசிய அரசுப் பேரவையினது 1979 ஆம் ஆண்டின் 15 ஆம் இலக்க**
**குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவைச் சட்டத்தின் 115 (1), (2), (3), (4),**
**120 (1), (2), (3) ஆகிய பிரிவுகளின் கீழான அறிக்கை**

කොටුව ගරු.
**මහේස්ත්‍රාත්වරයා වෙතය,**
**நீதிவானுக்கு** පාස්කු ප්‍රහාරය හා සම්බන්ධයෙන් ලද බුද්ධි තොරතුර නිසි පරිදි විමර්ශන සිදු නොකිරීම හේතුවෙන් පාස්කු ප්‍රහාරය සිදුව දෙස් විදෙස් පුද්ගලයින් ------දෙනෙකු මියායම හා තවත් දෙස් විදෙස් පුද්ගලයින් -----දෙනෙකු බරපතල තුවාල ලැබීම **බවට**

~~අංක 335/3 බී, දේවාල පාර, කටුවාන, හෝමාගම.~~ ........ **පදිංචි**

ලේකම් වසම් පාලිත රොහාන් සිරිවර්ධන ........ **විසින්**

2024.06.24 ........ **වැනි දින කරන ලද පැමිණිල්ල විභාග කළ බව** අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ........ **හි** මිනිමැරුම් විමර්ශන අංශයේ ස්ථානාධිපති පු.පො.ප. ඩී.කේ.ඉන්දුක ද සිල්වා **වන මම මෙයින් වාර්තා කරමි.**

........ என்னுமிடத்தைச் சேர்ந்த
........ ஆகிய நான்
20........ ஆம் ஆண்டு ........ மாதம் ........ நாளன்று ........
என்னுமிடத்தைச் சேர்ந்த ........ என்பவர் செய்த ........
........
........ என்ற பொருள்படும் முறைப்பாட்டினைப் பற்றி விசாரித்துள்ளேன் என இத்தால் அறிக்கையிடுகின்றேன்.

| | |
|---|---|
| **පරීක්ෂණයේදී නිශ්චය කොට දැනගත් කරුණු සහ පැමිණිල්ල සනාථ කරන තවත් සාක්ෂි කරුවන් සිටිවෙතු වෙත් නම්, ඔවුන්ගේ සාක්ෂි**<br>விசாரணையில் கண்டறியப்பட்ட நிகழ்வுகளும் முறைப்பாட்டுக்காதாரமாக மேலதிக சாட்சிகளின் சான்று ஏதேனும் இருப்பின் அதுவும் | ........<br>........ |
| **චූදිතයාගේ සාක්ෂිකරුවන්ගේ නම් හා ලිපිනය සහ ඔවුන්ගේ සාක්ෂි කෙටියෙන්.**<br>குற்றஞ்சாட்டப்பட்டவினது சாட்சிகளின் பெயரும் முகவரியும் சுருக்கமாக அவர்களது சாட்சியமும். | කරුණාකර අනෙක් පිටුව බලන්න.<br>........→........ |
| **චූදිතයා අධිකරණයට යවන ලද්දේ සිරභාරයේ ද නැතහොත් ඇප පිට ද යන වග, ඇප පිට නම්, ඇප සිප්පු ඇමිණිය යුතුය**<br>குற்றஞ்சாட்டப்பட்டவர் கட்டுக்காவலிலா அல்லது பிணையிலா விடப்பட்டுள்ளார் என்பது. பிணையிலாயின் பிணைமுறிகள் இணைக்கப்பட வேண்டும். | ........<br>........ |
| **ඉදිරිපත් කෙරෙන ද්‍රව්‍ය කිසිවක් අධිකරණය වෙත යවා ඇත්නම් ඒ පිළිබඳ ලැයිස්තුව**<br>நீதிமன்றத்துக்களுப்பப்பட்ட சான்றுப் பொருள்கள், எவையேனும் இருப்பின் அவற்றின் நிரல் | ........<br>........ |

........

**විමර්ශනය භාර නිලධරයා.**
புலன்விசாரணைக்குப் பொறுப்பான உத்தியோகத்தர்.

2019.04.09 වන දින රාජ්‍ය බුද්ධි සේවාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා වෙත පිටපතක් සහිතව ගරු පොලිස්පතිතුමා වෙත යොමු කරන ලද "අති රහසයයි" යනුවෙන් සඳහන් බුද්ධි තොරතුරේ සඳහන් කරුණු සම්බන්ධයෙන් නිසි පරිදි විමර්ශනය නොකිරීම හේතුවෙන් 2019.04.21 වන දින පාස්කු ප්‍රහාරය සිදුවූ ඇති බවත්, එමගින් දෙස් විදෙස් ජාතිකයින් විශාල ප්‍රමාණයක් මියගොස් තවත් දෙස් විදෙස් ජාතිකයින් විශාල ප්‍රමාණයක් බරපතල තුවාල ලබා ඇති බවට, සඳහන් කරමින් විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති පාලිත සිරිවර්ධන මහතා විසින් 2024.06.24 වන දින පොලිස්පතිතුමා වෙත පැමිණිල්ලක් යොමු කරමින් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරන ලෙසට ඉල්ලීමක් කර ඇති බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

02. පොලිස්පතිතුමා විසින් එම ලිඛිත පැමිණිල්ල සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිතුමා වෙත හා අධ්‍යක්ෂතුමා වෙත ලබාදෙන ලද උපදෙස් පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මිනිමැරුම් විමර්ශන අංශය මගින් ඉදිරි විමර්ශන කටයුතු 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 125 වන වගන්තිය ප්‍රකාරව සිදුකරනු ලබන බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

03. විමර්ශන කටයුතු ආරම්භ කරමින් 2024.07.06 වන දින පැමිණිලිකරු වන අංක 335/3 බී, දේවාල පාර, කටුවාන, හෝමාගම. ලිපිනයේ පදිංචි විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති ලේකම් වසම් පාලිත රොහාන් සිරිවර්ධන මහතාගේ ප්‍රකාශය සටහන් කිරීමේදී ඒ මහතා විසින් පහත සඳහන් කරුණු අනාවරණය කර ඇති බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කරමි.

<u>ලේකම් වසම් පාලිත රොහාන් සිරිවර්ධන. අංක 335/3 බී, දේවාල පාර, කටුවාන, හෝමාගම. ( විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති )</u>

1979 වසරේදී ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් සේවයට බැදී 2018 වසර වනවිට නියෝජ්‍ය පොලිස්පති තනතුරට උසස්වීම් ලද බවත්, 2019 ජුනි මස 04 වන දින නියෝජ්‍ය පොලිස්පති කෑගල්ල දිසාව භාරව කටයුතු කිරීමෙන් අනතුරුව විශ්‍රාම ලැබූ බවත්, තමා 2018 වර්ෂයේ නියෝජ්‍ය පොලිස්පති කෑගල්ල වශයෙන් කටයුතු කරන ලද කාලයේදී 2018.12.23 වන දින හා 26 වන දින සහරාන් හසීම් නැමැත්තාගේ තව්හිද් ජමාත් ත්‍රස්තවාදී කල්ලිය විසින් මාවනැල්ල ප්‍රදේශයේ බුද්ධ ප්‍රතිමා 04 කට අලාභ හානි සිදුකර, ජාතිවාදී කෝලාහලයක් ඇති කිරීමට උත්සාහ කරන ලද බවත්, ඒ සම්බන්ධයෙන් තමාගේ අධීක්ෂණය යටතේ පොලිස් නිලධාරීන් විමර්ශන පවත්වා එම සිද්ධියට සම්බන්ධ සැකකරුවන් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගත් බවත්, මේ සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන සිදුකිරීම සඳහා පොලිස්පතිතුමාගේ නියෝග පරිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදුන් බවත්, 2019 ජනවාරි මාසයේදී කෑගල්ල පොලිස් කොට්ඨාශයේ නිලධාරීන්ගේ සහය ඇතිව පුත්තලම වනාතවිල්ලුව ප්‍රදේශයේ දී සහරාන් ඇතුළු ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් පවත්වාගෙන යන ලද විශාල කඳවුරක් සොයාගත් බවත්, ඒ තුළ තිබූ පුපුරණ ද්‍රව්‍ය කිලෝ 100 ට අධික ප්‍රමාණයක් හා සංග්‍රාමික උපකරණ විශාල ප්‍රමාණයක් සොයාගත් බවත්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී මෙම පුහුණු කඳවුර පවත්වාගෙන යාම සඳහා නායකත්වය දී කටයුතු කර ඇත්තේ 'සහරාන්' නැමැති අය බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අනාවරණය කරගත් බවත්, මෙම ත්‍රස්තවාදී කණ්ඩායම පිළිබඳ සියළු කරුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අනාවරණය කරගෙන තිබියදීත් ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා කටයුතු නොකිරීම හේතුවෙන් 2019.04.21 වන දින ප්‍රහාරයක් එල්ලවීමෙන් මනුෂ්‍ය ජීවිත 200 කට ආසන්න ප්‍රමාණයක් නැතිවූ බවත්, තමා විශ්‍රාම ලබා නිවසේ සිටියදී මෙම ප්‍රහාරයන් සම්බන්ධයෙන් පරීක්ෂා කරමින් සිටියදී තමාගේ නිවසේ ලියුම් පෙට්ටිය වෙත කිසිවකු විසින් පාස්කු ප්‍රහාරය හා සම්බන්ධයෙන් මෙතෙක් අනාවරණය නොවූ කරුණු ඇතුළත් ලිපියක් සහ එම ලිපියට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එවනු ලබන ලේඛනයක පිටපතක් හා යවනු ලබන ලේඛනයක පිටපතක් අමුණා තිබූ බවත්, තමා විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී එම ලිපිය රාජ්‍ය බුද්ධි සේවාවේ නිලන්ත ජයවර්ධන මහතා විසින් "අති රහසයයි" යනුවෙන් මුද්‍රා තබා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව 2019.04.09 වන දින පොලිස්පති පූජිත ජයසුන්දර මහතා වෙත රාජ්‍ය බුද්ධි සේවාවේ ලිපි අංක S 16612/19 යටතේ 'තව්හිත් ජමාත් නායක මොහොමඩ් සහරාන්' විසින් මෙරටට මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන ලද බවට තොරතුරත් සම්බන්ධව යන මාතෘකාව යටතේ එවන ලද වැදගත් තොරතුරු සහිත

ලිපියක් බවත්, එහි 'තවුහීත් ජමාත් නායක මොහොමඩ් සහරාන්' විසින් ඔහුගේ අනුගාමිකයින් එක්ව මේ රට තුළ මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල කිරීමේ සූදානමක් පවතින බවට විදේශ බුද්ධි අංශයක් විසින් වාර්තා ගත කරන ලද තොරතුරක් එහි අන්තර්ගතව තිබූ බවත්. මෙම ප්‍රහාරය පහත සඳහන් ක්‍රම මගින් සිදු කිරීමට සූදානම් වන බවට ලිපියෙන් දැනුවත් මරාගෙන මැරෙන ප්‍රහාරයක්, ආයුධ සන්නද්ධ ප්‍රහාරයක්, තියුණු ආයුධ ප්‍රහාරයක්. වාහනයක් යොදාගෙන සිදුකරන ප්‍රහාරයක් වශයෙන්ද, මෙම ප්‍රහාරය සඳහා සූදානම් වන සැකකරුවන් සම්බන්ධයෙන්ද, සඳහන්ව තිබූ බවත්, මෙම පාස්කු ප්‍රහාරයෙන් අනතුරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා විසින් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලද පාර්ලිමේන්තු කාරක සභාවේ ලබාදී ඇති සාක්ෂියේදී " ***අප්‍රේල් මස 09 වෙනිදා හෝ 10 වෙනිදා රාජ්‍ය බුද්ධි අංශය මගින් එවන ලද සැකකරුවන්ගේ නම් සහිත ලිපිය අපට ලැබුණා. ඒ වන විටත් එතනින් තිහිප දෙනෙකු සැකකරුවන් ලෙස අප හඳුනාගෙන තිබ්බා"*** යනුවෙන් සඳහන් කර ඇති අතර ඒ අනුව මෙම පාස්කු ප්‍රහාරය වනතෙක් දින 11 ක් නිසි පියවර ගෙන නොමැති බවත්, මෙම ප්‍රහාරය සිදුවීම වළක්වා ගැනිම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත හැකියාවක් තිබූ බවත්. නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා විසින් මෙ සම්බන්ධයෙන් නිසි පියවර නොගෙන ඇති බව සඳහන් කරමින් ප්‍රකාශයක් ලබා දී ඇත.

04. ඉහත ප්‍රකාශයෙන් අනාවරණය වූ කරුණු අනුව රාජ්‍ය බුද්ධි සේවාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා වෙත පිටපතක් සහිතව පොලිස්පතිතුමා වෙත 2019.04.09 වන දින යොමු කර ඇති යොමු කරන ලද පාස්කු ප්‍රහාරය හා සම්බන්ධ ලිපිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු වූ දිනය හා වේලාව සනාථ කර ගැනිම සඳහා සහ එම **"අති රහසයයි"** යනුවෙන් මුද්‍රාව යෙදූ ලිපිය සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද යන්න සම්බන්ධයෙන් එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ සේවය කරන ලද පහත සඳහන් නිලධාරින්ගේ ප්‍රකාශයන් සටහන් කරන ලද අතර එම ප්‍රකාශයන්ගේ සාරාංශ ගත කරුණු පහත පරිදි ඉදිරිපත් කර සිටිමි.

**I. <u>අහංගම දික්කුඹුරගේ ප්‍රියංගිකා සුදර්ශනී. අංක 1251, මුනියම්මාගම, තිස්සමහාරාමය. (කාන්තා පොලිස් කොස්තාපල් 8326)</u>**

මැය 2009.01.04 වන දින ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් වරියක් වශයෙන් සේවයට බැදි කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයෙන් මූලික පුහුණුව ලබා 2009.07.25 වන දින සිට මේ දක්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන බවත්, 2019 ජනවාරි මාසයේ සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට අනියුක්තව සේවය කල බවත්, 2019.04.16 වන දින **"ජාතික තවුහීත් ජමාත්"** නායක මොහොමඩ් සහරාන් විසින් මෙරට මරාගෙන මැරෙන ප්‍රහාරයක් සම්බන්ධ තොරතුරු ඇතුළත් ලිපිය එවනු ලබන ලේඛණයේ අනු අංක 658 යටතේ ඇතුළත් කල බවත්, එම ලිපිය 2019.04.16 වන දින තමා අතට පත්වන විට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා විසින් ලිපිය කියවා බලා දින මුද්‍රාව 2019.04.16 ලෙස සටහන් කර එතුමාගේ කෙටි අත්සන යොදා පුද්ගලික සහකාර පොලිස් අධිකාරි රංජිත් වෙදසිංහ මහතා විසින් සටහනක් යොදා තිබූ බවත්, ලිත් දිනය ලෙස 2019.05.01 වන දින සටහන්ව තිබූ බැවින් අනෙකුත් ලිපි වලට ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කල බවත්, පසුව මැය විසින් මෙම ලිපිය 2019.04.19 වන දින යවනු ලබන ලේඛනයේ අනු අංක 984 යටතේ ඇතුළත් කලද, එදින මැයට එය මහා සිකුරාදා දිනය හේතුවෙන් අ.ප.දෙ. වරු නිවාඩු දිනයක් නිසා භාරදීම සඳහා නොහැකි වූ බවත්, පසුව මැය පසු දින සිට නිවාඩු ලබා පිටව යාමට සිටි බැවින් මැය 2019.04.19 වන දින සවස පිටවීමේ සටහන් යොදා පිටව ගිය බවත්, 2019.04.21 වන දින පාස්කු ප්‍රහාරය සිදුවීමෙන් අනතුරුව පොලිස් නිලධාරින්ගේ නිවාඩු අවලංගු වීම හේතුවෙන් නැවත 2019.04.22 වන රාජකාරි සඳහා වාර්තා කල බවත්, ඒ අනුව මැය විසින් එදින ප්‍රශ්න ගත ලිපිය නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය වෙත භාරදීම සඳහා කටයුතු කල බවත්, සඳහන් කරමින් ප්‍රකාශයක් ලබාදී ඇත.

**II. <u>තුවාන් ඉෂාන් රාබන්. නො.200/බී, බංගලාවත්ත, කොට්ටාව. ( ප්‍රධාන පොලිස් පරීක්ෂක)</u>**

මොහු 1989.04.06 වන දින උපසේවා උප පොලිස් පරීක්ෂක වරයෙකු ලෙස කටාන පුහුණු පාසලේ පුහුණුව ලබා විවිධ ප්‍රදේශවල සේවය කිරිමෙන් අනතුරුව 1995.05.06 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත රාජකාරි වාර්තා කල බවත් ඉන් අනතුරුව විවිධ අංශයන්ගේ රාජකාරි කර 2018.01.01 වන දින සිට මේ දක්වා

අ.ප.දෙ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ ස්ථානාධිපති වශයෙන් සේවය කරන බවත් ප්‍රශ්නගත ලිපිය හා සම්බන්ධයෙන් තොහු විසින් ජනාධිපති කොමිෂන් සභාවට අවස්ථා දෙකකදී ප්‍රකාශ ලබාදී ඇති බවත් එම ලිපිය 2019.04.10 වන දින මෙම දෙපාර්තමේන්තුවට ලැබී ඇති අතර එය අති රහසිගත ලිපියක් වශයෙන් ලැබී ඇති අතර එම ලිපිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවිසෙනෙවිරත්න මහතා විසින් 2019.04.16 වන දින දැක ඇති බවට තමාට නිරීක්ෂණය වූ බවත් එම ලිපියේ සටහනක් එතුමාගේ පුද්ගලික සහකාර වශයෙන් කටයුතු කල පොලිස් අධිකාරී රංජිත් වෙදසිංහ මහතා යොදා ඇති බවද මෙම ප්‍රශ්නගත ලිපිය 2019.04.10 වන දින නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය වෙත පොලිස් කොස්තාපල් රණසිංහ විසින් රැගෙන විත් ඇති අතර, මෙම ලිපිය රහසිගත ලිපියක් බැවින් එවැනි ලිපියක් ලැබුණු විට කාන්තා උප පොලිස් පරීක්ෂක දිප්ති නිලධාරිණිය විසින් භාර ගන්නා අතර, ඇය නොමැති අවස්ථා වලදී එම ලිපිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමාගේ කාර්යාලයේ මේසය උඩ තබන බවත්, කාන්තා උප පොලිස් පරීක්ෂක දිප්ති නිලධාරිණිය කාර්යාලයට පැමිණි පසු ඇයට එම ලිපි සම්බන්ධව දැනුවත් කරන බවත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමා වෙත ලැබෙන රහසිගත ලිපි තමා ඇතුළු නිලධාරීන් විවෘත නොකරන බවත්, එම ලිපි ඒ මහතා පැමිණෙන තෙක් තබා තිබෙන බවත්, හදිසි ලිපි සම්බන්ධයෙන් කුමන හෝ ආකාරයකින් ඒ මහතා වෙත දැනුම් දෙන බවත්, මෙම ලිපිය සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවක කිසිදු නිලධාරියෙකු දැනුවත් කර නොමැති බවත්, 2019.04.08 වන දින සිට 2019.04.13 දක්වා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනවිරත්න මහතා විදේශගතව සිටි බවත්, එම කාලය තුලදී නියෝජ්‍ය පොලිස්පති නාගහමුල්ල මහතා විසින් රාජකාරි ආවරණය කල බවත්, නමුත් ඒ මහතා වෙත මෙම ප්‍රශ්නගත ලිපිය යොමු නොකර ඇත්තේ මෙම ලිපියේ **'අති රහස්‍යයි'** වශයෙන් සඳහන් කර තිබූ බැවින් එවැනි ලිපි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනවිරත්න මහතා විසින්ම බැලිය යුතු බවට එතුමා විසින් වාචික නියෝගයක් ලබා දී තිබීම නිසා බවත්, සඳහන් කරමින් ප්‍රකාශයක් ලබා දී ඇත.

**III.** <u>කාරියවසම් හේවාමානගේ තුෂාරි දීප්ති. අංක 638/02, ගෝවින්න මාවත, අතුරුගිරිය. ( කාන්තා උප පොලිස් පරීක්ෂක)</u>

මැය 1997.04.01 වන දින ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් වරියක් වශයෙන් සේවට බැදී මුලික පුහුණුව තිකවැරටිය පොලිස් අභ්‍යාස විද්‍යාලයෙන් ලැබීමෙන් අනතුරුව මැය දිවයිනේ විවිධ ප්‍රදේශ වල රාජකාරි සිදුකිරිමෙන් පසුව 2012 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ මුලදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රාජකාරි සඳහා වාර්තා කල බවත්, ඉන් අනතුරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට අනුයුක්තව සේවය කල බවත්, මැය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පහත මාලය වෙත ලැබෙන ලිපි භාර ගැනිමේ කටයුතු සිදුකල බවත්, එම ලිපි ලබා ගැනිමෙන් පසුව මැය විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරට ලැබෙන ලිපි මැය විසින් විවෘත කර කියවා බලා දින මුද්‍රාව තබා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න මහතා වෙත ඉදිරිපත් කරන බවත්, එහි දින මුද්‍රාව තබා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න මහතා වෙත ඉදිරිපත් කිරිමෙන් අනතුරුව ඒ මහතා විසින් මැය වෙත නැවත ලබාදෙන බවත්, එම ලිපි සඳහා පුද්ගලික සහකාර පොලිස් අධිකාරි රංජිත් මහතා විසින් සටහනක් යෙදූ පසුව නැවත ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න මහතා විසින් අත්සන කර ලබාදිමෙන් අනතුරුව ලිපි යොමු කරන නිලධාරින් විසින් අංශ වෙත යොමු කරන බවත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න මහතා නමින් හා **රහස්‍යයි/ රහසිගතයි/ අති රහස්‍යයි** යනුවෙන් සඳහන් කර එවනු ලබන ලිපි මා විසින් භාරගෙන විවෘත නොකරමින් රවී සෙනෙවිරත්න මහතා වෙත භාරදෙන බවත්, එතුමා විසින් එය කියවා බලා දින මුද්‍රාව මත අත්සන යොදන බවත්, ලිපියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පොලිස් අධිකාරි රංජිත් වෙදසිංහ මහතා සමගින් සාකච්ජා කර සටහනක් ඇතුලත් කරන බවත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න මහතා විදේශගතව හෝ නිවාඩු ලබා සිටින අවස්ථාවන් වලදී **රහස්‍යයි/ රහසිගතයි/ අති රහස්‍යයි** යනුවෙන් ලැබෙන ලිපි විවෘත නොකරන ලෙසට වාචික උපදෙස් ලබා දී ඇති බවත්, , මෙම ප්‍රශ්න ගත ලිපිය මැය විසින් 2019.04.10 සහ 11 වන දින නිවාඩු ලබා සිටි බැවින් පොලිස් කොස්තාපල් රණසිංහ නිලධාරියා විසින් මැය වෙත නිවාඩු ලබා පැමිණිමෙන් පසුව 2019.04.12 වන දින භාරදිමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනවිරත්න මහතා විදේශ ගතව සිටි බැවින් එතුමාගේ මේසය මත තැබූ බවත්, මැය විසින් මෙම ප්‍රශ්නගත ලිපිය 2019.04.16 වන දින කාන්තා පොලිස් කොස්තාපල් 8326 සුදර්ශනී නිලධාරිණිය වෙත භාරදුන් බවත් සඳහන් කරමින් ප්‍රකාශයක් ලබා දී ඇත

05 ඉහත ප්‍රකාශයන් මගින් අනාවරණය වූ කරුණු අනුව 2019.04.09 වන දින රාජ්‍ය බුද්ධි සේවාවේ පොලිස් සැරයන් 32672 නිලධාරියා විසින් ප්‍රශ්නගත ලිපිය එදින සවස් කාලයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ

පහත මාලයේ රාජකාරි නිරත පොලිස් කොස්තාපල් 92653 ඉරුදියදාස් නිලධාරියා වෙත භාරදීමට කටයුතු කර ඇති අතර එම නිලධාරියා විසින් එදින රාත්‍රී කාලයේදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ කාර්යාලයේ නිලධාරින් නොමැති වීම හේතුවෙන් පසු දින එනම් 2019.04.10 වන දින පැය 07.25 ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ කාර්යාලයේ සේවය කරනු ලබන පොලිස් කොස්තාපල් 12163 රණසිංහ නිලධාරියාට භාරදීමට කටයුතු කර ඇති බවට එම නිලධාරින්ගේ ප්‍රකාශ හා ලේඛන අනුව අනාවරණය වී ඇති බව ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

06. ඉහත සඳහන් කරුණු අනුව රාජ්‍ය බුද්ධි සේවාව විසින් යොමු කල ලිපිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය වෙත පොලිස් කොස්තාපල් 12163 රණසිංහ නිලධාරියා විසින් රැගෙන ඒම සිදුකලත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා 2019.04.08 වන දින සිට 2019.04.13 වන දින දක්වා විදේශ ගතව සිටීම හේතුවෙන් ප්‍රශ්නගත ලිපිය කාර්යාලය වෙත රැගෙන ඒමෙන් පසුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතාගේ මේසය මත තබා ඇති අතර 2019.04.16 වන දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා වෙත කාන්තා උප පොලිස් පරීක්ෂක දිප්ති නිලධාරිණිය විසින් දින මුද්‍රාව සහිතව විවෘත කර ලබාදීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමා විසින් එය පරීක්ෂා කර දින මුද්‍රාව තුළ කෙටි අත්සන යොදා ඇත. අනතුරුව කාන්තා උප පොලිස් පරීක්ෂක දිප්ති නිලධාරිණිය විසින් එම ලිපිය ඉදිරි පියවර සඳහා නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ රාජකාරි නිරත කාන්තා පොලිස් කොස්තාපල් 8326 සුදර්ශනී නිලධාරිණිය වෙත ලබාදී ඇති බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කරමි.

07. ඉහත ප්‍රශ්නගත ලිපිය කාන්තා පොලිස් කොස්තාපල් 8326 සුදර්ශනී නිලධාරිණිය විසින් ලේඛන යථාවත් කර එම ලිපිය නියෝජ්‍ය පොලිස්පති නාගහමුල්ල මහතා වෙත යොමු කිරීම සඳහා යවනු ලබන ලේඛනයට ඇතුළත් කර ඇති අතර කාන්තා පොලිස් කොස්තාපල් 8326 සුදර්ශනී නිලධාරිණිය එම ලිපිය නිසියාකාරව භාරදීමක් සිදු නොකර ඇය 2019.04.20 වන දින සිට නිවාඩු ලබා යන බවට 2019.04.19 වන දින පිටවීමේ සටහන් යොදා පිටව ගොස් ඇති අතර මෙම ප්‍රශ්නගත ලිපිය නියෝජ්‍ය පෙලිස්පති කාර්යාලය වෙත යොමු කිරීම සඳහා ඇය විසින් කටයුතු නොකර ප්‍රශ්නගත ලිපිය තවත් ලිපි 03 ක් සමගින් 2019.04.22 දින නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය වෙත භාරදීම සඳහා කටයුතු කර ඇත.

08. මෙම ලිපිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා විසින් පරීක්ෂා කර ඇතත් ඒහි සඳහන් කර ඇති සටහන් යෙදූ දිනය කවදාද? යන්න නිසියාකාරව ඇතුළත් කර නොමැති අතර නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ රාජකාරි කරනු ලබන ප්‍රධාන පොලිස් පරීක්ෂක තුවාන් ඉෂාන් රාබන් මහතාගේ ප්‍රකාශය අනුව මෙම ප්‍රශ්නගත ලිපිය ඔහු වෙත පෙන්වා ඇති අතර එහිදී මෙම ලිපියේ සඳහන් සටහන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතාගේ පුද්ගලික සහකාර වශයෙන් කටයුතු කරනු ලබන රංජිත් වෙදසිංහ මහතා විසින් සටහන් යොදා ඇති බවට සඳහන් කර ඇත. බැහැර ලේඛන අංකය 2019.04.19 වන දින ලෙසට සඳහන්ව ඇතත් එය නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය වෙත යොමු කිරීම සඳහා කටයුතු කර ඇත්තේ 2019.04.22 වන දින එනම් මෙම පාස්කු ප්‍රහාරය සිදුවූ දිනට පසු දිනයේදියි. ඒ අනුව මෙම ආන්දෝලනාත්මක කරුණු ඇතුළත් ප්‍රශ්නගත ලිපිය හා සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා 2019.04.16 වන දින පරීක්ෂා කර ඇතත් ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා කටයුතු කර නොමැති බව සහ කාන්තා පොලිස් කොස්තාපල් 8326 සුදර්ශනී නිලධාරිණිය මෙම ලිපිය සන්තකයේ තබා ගනිමින් ඇය විසින් නිවාඩු ලබා පිටව ගොස් සිට 2019.04.21 වන දින සිදු වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් නිවාඩු අවලංගු වීම නිසාවෙන් 2019.04.22 වන දින ඇය නැවත රාජකාරි වාර්තා කිරීමෙන් අනතුරුව එදින නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය වෙත මෙම ප්‍රශ්නගත ලිපිය යොමු කිරීම සඳහා කටයුතු කර ඇති බව අනාවරණය වී ඇති බව ගරු අධිකරණයට වාර්තා කර සිටිමි.

09. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ නිලධාරින්ගේ ප්‍රකාශයන් අනුව මෙම රවී සෙනෙවිරත්න මහතා විසින් එම කාර්යාලයේ නිලධාරින් වෙත දන්වා ඇත්තේ "**රහස්‍යයි/ රහසිගතයි/ අති රහස්‍යයි** " ලිපි ඒ මහතා විසින්ම බැලිය යුතු බවට වාචික උපදෙස් ලබා දී ඇති බවත්, මෙම ලිපි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ කාර්යාලයේ මේසය මත තබන බවත්, ඒ හේතුව නිසාවෙන් එම මහතා විදේශ ගතව සිටින හෝ නිවාඩු ලබා නැවත පැමිණෙන තෙක් ඉතා දිර්ඝ කාලයක් වුවද මෙවැනි ආන්දෝලනාත්මක කරුණු ඇතුළත් ලිපි, බුද්ධි තොරතුරු ඇතුළත් ලිපි, විශේෂිත කරුණු ඇතුළත් ලිපි හා ජාතික ආරක්ෂාව කෙරෙහි බලපාන සංවේදී කරුණු ඇතුළත් ලිපි සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු නොකරමින්

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනෙවිරත්න මහතා කටයුතු කර ඇති බවට අනාවරණය වී ඇති බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

10. වැඩිදුරටත් සිදුකරන ලද විමර්ශනයේදී රාජ්‍ය බුද්ධි සේවාවේ නියෝජ්‍ය පොලිස්පතිව සිටින දීගොඩ ගමගේ නිලන්ත ජයවර්ධන මහතාගේ ප්‍රකාශයක් 2024.08.15 වන දින සටහන් කර ඇති අතර එම ප්‍රකාශය අනුව ඒ මහතා විසින් පහත සඳහන් කරුණු අනාවරණය කර ඇති බව වාර්තා කර සිටිමි.

<u>**දීගොඩ ගමගේ නිලන්ත ජයවර්ධන. අංක 17/01, මැලිබන් ආරාම පාර, බැද්දගාන, පිටකෝට්ටේ.(ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති.)**</u>

1998.02.23 වන දින ආධුනික සහකාර පොලිස් අධිකාරිවරයෙකු වශයෙන් පොලිස් සේවයට බැඳී වසර 26 ක කාලයක් සේවයේ නිරතව සිටින බවත්, 2024.07.18 වන දින සිට සිට පොලිස් කොමිෂන් සභාවේ නියෝග පරිදි අනිවාර්ය නිවාඩු ගන්වා ඉහත ලිපිනයේ පදිංචිව සිටින බවත්, 2000.01.15 වන දින සිට 2019 දෙසැම්බර් දක්වා රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා වශයෙන් රාජකාරි කටයුතු කල බවත්, මෙම ප්‍රශ්නගත ලිපිය වන අංක S 1612/19 දරන “ අති රහස්‍යයි” සඳහන් ලිපි පිටපත පරීක්ෂා කර බැලීමේදී එය පොලිස්පතිතුමා වෙත හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරන ලද තවුහීත් ජමාත් සංවිධානයේ සහරාන් හිෂ්මි විසින් මරාගෙන මැරෙන ප්‍රහාරයක්, අවි ප්‍රහාරයක්, පිහියකින් අපරාධයක් හෝ ට්‍රක් රථයක් භාවිතා කරමින් ප්‍රහාරයක් එල්ල කරන බවට මහ කොමසාරිස් කාර්යාලයේ රාජකාරි නිරත නිලධාරියෙකුගෙන් දුරකථන ඇමතුමක් ලැබුණු බවත්, එම තොරතුර පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් සවිස්තරාත්මක තොරතුරුකරු වෙත සාකච්ඡා කර තොරතුරු පිළිබඳ වැඩිදුර කරුණු සොයා බැලීම සඳහා ඉන්දියානු බුද්ධි අංශය වන “රෝ” සේවාව වෙත දැනුවත් කල බවත්, 2019 අප්‍රේල් 05 වන දින ලබාදෙන ලද ලිඛිත තොරතුර අනුව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා වැදගත් පල්ලි වලට ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කරන බවත්, ඒ අනුව ඒ මහතා විසින් නිලධාරින් කණ්ඩායමක් නැගෙනහිර ප්‍රදේශය වෙත යොමු කර එවකට ආරක්ෂක අමාත්‍යංශයේ ජාතික බුද්ධි ප්‍රධානි සිසිර මෙන්ඩිස් මහතා වෙත 2019 අප්‍රේල් මස 07 වන දින බුද්ධි තොරතුර සම්බන්ධයෙන් ලිඛිතව වාර්තා කර ඒ සම්බන්ධයෙන් දුරකථනයෙන් දැනුම් දීමෙන් අනතුරුව තමා විසින් අදාල අංශ මගින් සකස් කරන ලද ලිඛිත වාර්තාව 2019.අප්‍රේල් මස 09 වන දින පොලිස්පති පූජිත ජයසුන්දර මහතා වෙත හා පිටපතක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද බවත්, එසේ පිටපත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට හේතුව වශයෙන් 2018 අවසාන භාගයේදී වවුනතිව් ප්‍රදේශයේ සිදු වූ ඉතා අමානුෂික ලෙස බෙල්ල කපා පොලිස් නිලධාරින් දෙදෙනෙකු ඝාතනය කිරීමේ සිද්ධියට අදාල විමර්ශන කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරගෙන තිබීමත්, මාවනැල්ල ප්‍රදේශයේ බුදු පිළිම ඇතුළු ආගමික පිළිරූ විනාශ කිරීමට අදාල සිද්ධිය පිළිබඳ විමර්ශනයද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරගෙන තිබීමත්, 2019 ජනවාරි මාසයේදී වනාතවිල්ලුව ප්‍රදේශයේදී පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම යන විමර්ශන වලදී මුස්ලිම් අන්තවාදීන් වන සහරාන් ඇතුළු කණ්ඩායම මෙම සිද්ධියට සම්බන්ධ බවට අනාවරණය කරගෙන තිබූ බවත්, එම හේතුව නිසාවෙන් පොලිස්පතිතුමා වෙත යොමු කරන ලද “අති රහස්‍යයි” ලිපියේ පිටපතක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනෙවිරත්න මහතා වෙත යොමු කල බවත්, 2019.04.16 වන දින කාත්තන්කුඩි තාලන්කුඩා ප්‍රදේශයේදී යතුරු පැදියක බෝම්බ අටවා පුපුරවා හැරීම සම්බන්ධ සිද්ධිය සහරාන් නැමැත්තාගේ පෙරහුරුවක් බවට පොලිස්පතිතුමා වෙත 2019.04.19 වන දින වාර්තාවක් යොමු කරමින් මෙම විමර්ශන කටයුතුද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලෙසට ඉල්ලීමක් කල බවත්, මෙම සහරාන්ගේ සමීපතයින් සම්බන්ධ විශේෂ වාර්තාවක් 2019.04.20 වන දින පොලිස්පතිතුමා වෙත හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කල බවත්, 2019.04.20 වන දින පැය 1654 ට රාජකාරි දුරකථනයෙන් 2021.04.21 වන දින සිදුවිය හැකි ප්‍රහාරය සම්බන්ධයෙන් නිශ්චිත තොරතුර තමා විසින් ‘වට්ස්ඇප්’ පණිවිඩයක් මගින් රවි සෙනෙවිරත්න මහතා වෙත යොමු කල බවත්, එයට පිළිතුරු වශයෙන් “තැන්ක්ස් නිලන්ත” යනුවෙන් සඳහන් පණිවිඩයක් ලැබුණු බවත්, තමා විසින් 2019.01.31 වන දින අංක S 532/19 යටතේ ISIS මත වාදයට නැඹුරු වූ ශ්‍රී ලාංකිකයින් 129 දෙනෙකු සම්බන්ධයෙන් යොමු කල බවත්, තමා විසින් 2015 වසරේ සිට සහරාන් සහ ඔහුගේ අනුගාමිකයින් විසින් මෙරට අන්‍ය ආගමිකයින් ඝාතනය කිරීමේ වියරුවකින් මතවාද ප්‍රචාරය කරන බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් අංශයන් දැනුවත් කිරීමට කටයුතු කල බවත්, තමා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පවතින විශේෂ දැනුම හා ප්‍රාගුණ්‍ය යොදාගෙන මෙම ක්‍රියාකාරකම් වැඩ පැවැත්වීමේ

හැකියාවක් ඇති බවට තමා සිතූ නිසාවෙන් මෙම තොරතුරු වරින් වර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමුකල බවට සදහන් කරමින් ප්‍රකාශයක් ලබා දී ඇත.

11. ඉහත ප්‍රකාශය මගින් අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී රාජ්‍ය බුද්ධි සේවාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් පහත සදහන් දිනයන් වලදී පහත සදහන් කරුණු ඇතුළත් ලිපි පොලිස්පතිතුමා වෙත හා පිටපත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්මේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනෙවිරත්න මහතා වෙත යොමු කර ඇති බවට අනාවරණය වී ඇති බව වාර්තා කර සිටිමි.

I. 2019.01.25 වන දින S 435/2019 දරන ලිපිය මගින් 'සහරාන්' නැමති අන්තවාදියා විසින් ජාත්‍යන්තර ත්‍රස්තවාදි සංවිධාන මතවාද පෝෂණය කිරීමේ සම්බන්ධව ඔහු හා ඔහුගේ පුද්ගලික විස්තරද, ඥාතීන් සම්බන්ධ විස්තර ඇතුළත් සවිස්තර වාර්තාවක්,

II. 2019.01.25 වන දින S 5460/2018 යටතේ සබරගමු මධ්‍යම හා වයඹ පළාත්වල ස්ථාන කිහිපයක බෞද්ධ හින්දු කතෝලික ප්‍රතිමා වෙත ප්‍රහාර එල්ල කිරිම සම්බන්ධව තොරතුරු ඇතුළත් විස්තර වාර්තාවක්,

III. 2019.03.01 වන දින S 1036/2019 යටතේ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් නැමැත්තාගේ සමීපතයින් පිළිබදව වාර්තාවක්,

IV. 2019.03.21 වන දින S 1323/2019 යටතේ අන්‍යාගාමිකයින් (කාෆිර්වරුන්) ඉස්ලාමයේ සතුරන් බවට මවුලවිවරයෙකු විසින් ආගමික දේශනයක් පැවැත්විම සම්බන්ධ වාර්තාවක්,

V. 2019.03.30 වන දින S 1505/2019 යටතේ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් නැමැත්තා අත්අඩංගුවට ගැනිම සදහා ඔහු සැගවී සිටින ස්ථානයක් සම්බන්ධයෙන් දැනුවත් කරමින් වාර්තාවක්,

VI. 2019.04.09 වන දින S 1612/19 යටතේ 'ජාතික තව්හිත් ජමාත්' නායක මොහොමඩ් සහරාන් විසින් මෙරට මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයක් දියත් කිරීමට සැලසුම් කරන බවට ලද තොරතුරු සම්බන්ධ ප්‍රශ්නගත ලිපිය,

VII. 2019.04.18 වන දින S 1758/2019 යටතේ කාත්තන්කුඩි පොලිස් වසමේ තාලංකුඩා ප්‍රදේශයේදි යතුරු පැදියක් පුපුරුවා හැරිම සම්බන්ධ ලිපියක්,

VIII. 2019.04.19 වන දින S 1758/19 මොහෙමඩ් කාසිම් මොහොමඩ් සහරාන් ගේ සමීපතයෙකු මෙන්ම 2019.04.16 දින කාත්තන්කුඩිහිදි යතුරු පැදියකින් පුපුරුවා හැරිමට සම්බන්ධ පුද්ගලයෙකු සම්බන්ධ ලිපියක්,

IX. 2019.04.20 වන දින S 1758/19 යටතේ ජාතික තවුහිත් ජමාත් සංවිධානයේ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් නැමැත්තා හා ඔහුගේ පවුලේ පුද්ගලයින් සැගවී සිටින ස්ථානයක් පිළිබදව වාර්තාවක්,

12. මෙම ලිපි හා වාර්තා වලට අමතරව 2019.01.31 වන දින S 532/2019 යටතේ IS සහ ජාත්‍යන්තරයේ ක්‍රියාත්මක මුස්ලිම් ත්‍රස්තවාදි සංවිධාන වල මතවාද වලට නැඹුරු වී ඇති ශ්‍රී ලාංකිකයින් පිළිබදව යන මාතෘකාව යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනෙවිරත්න මහතා වෙත රාජ්‍ය බුද්ධි සේවාවේ නිලන්ත ජයවර්ධන මහතා විසින් IS සංවිධානයට සම්බන්ධව සිරියාවේදි මියගිය පුද්ගලයින් තිදෙනෙකුද, සිරියාව තුළ යුධ මෙහෙයුම් සහ සංවිධානයේ පරිපාලන කටයුතු සදහා සම්බන්ධ පුද්ගලයින් සිව් දෙනෙකුද, සිරියාවේ IS පාලන ප්‍රදේශ වෙත යාමේ බලාපොරොත්තුවෙන් සිටින පුද්ගලයින් දෙදෙනෙකුද, ඇඩිමතවාද වල පිහිටා කටයුතු කරන බවට හදුනාගත් පුද්ගලයින් 129 දෙනෙකු සම්බන්ධ පුද්ගලික විස්තර හා අන්තවාදි සම්බන්ධතාවය සදහන් කරමින් "අති රහසාය" වාර්තාවක් යොමු කිරිමට කටයුතු කර ඇතත් එම පුද්ගලයින් සම්බන්ධයෙන් ලද තොරතුරු වලට අදාලව යම් පියවරක් ගත් බවට අනාවරණය වී නොමැති අතර එම පුද්ගලයින් අතර මෙම අන්තවාදි ප්‍රහාරය දියත් කල පුද්ගලයින් සම්බන්ධ විස්තරද අන්තර්ගතව තිබී ඇති බවට ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

13. මෙම ප්‍රහාරය හේතුවෙන් 2019.04.21 වන දින දිවයින පුරා පිහිටි කතෝලික පල්ලිවල ඉරුදින දේව මෙහෙයේ වන්දනා කරමින් සිටින ලද ක්‍රිස්තියානු බැතිමතුන්ද, දේශිය විදේශිය ජාතිකයින්ගේ මරමස්ථානයක් බවට පත්වූ

කොළඹ ප්‍රදේශයේ ඉතා ප්‍රසිද්ධ හෝටල් වල මෙදින උදෑසන ආහාරය ලබා ගැනීම සඳහා පැමිණ සිටි දේශීය ජාතිකයින් අතරින් විදේශීය ජාතිකයින් ----------දෙනෙකු හා දේශීය ජාතිකයින් ---------දෙනෙකු මෙම ප්‍රහාරයෙන් මියගොස් දේශීය හා විදේශීය පුද්ගලයින් ------------දෙනෙකු බරපතල තුවාල ලබා ඇති බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

14. ඉහත කරුණු අනුව මෙම පාස්කු ප්‍රහාරය සිදුවීමට පෙර ඉන්දියානු බුද්ධි අංශ මගින් හා මෙරට රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරින් විසින් අවස්ථා ගණනාවකදී අනාවරණය කරගත් කරුණු සම්බන්ධයෙන් හා අන්තවාදී පුද්ගලයින් සම්බන්ධයෙන් පොලිස්පතිතුමා වෙත හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා වෙත යොමු කරන ලද "අති රහස්‍යය" වාර්තාව සම්බන්ධයෙන් නිසි පියවර නොගැනීම නිසාවෙන් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 1 වන කාණ්ඩයේ XXVIII වැනි පරිච්ඡේදයේ 3: 6 වගන්තියේ "රහස්‍ය" ලිපි සම්බන්ධයෙන් ගත යුතු නිසි ක්‍රමවේදයට පරිභාහිරව කටයුතු කිරීම නිසාවෙන් පාස්කු ප්‍රහාරය සිදුව එමගින් දෙස් විදෙස් පුද්ගලයින් විශාල ප්‍රමාණයකගේ මරණය සිදුවීම හා තවත් දෙස් විදෙස් ජාතිකයින් විශාල ප්‍රමාණයකට බරපතල තුවාල සිදුවීම තුලින් දණ්ඩ නීති සංග්‍රහයේ 289, 298 සහ පොලිස් ආඥා පනතේ 56 (ඉ), (ඊ) යන වගන්ති යටතේ දඩුවම් ලැබිය හැකි වරදවල් සිදුව ඇති බවට කරුණු අනාවරණය වන බැවින් මේ සම්බන්ධයෙන් තව දුරටත් විමර්ශන සිදුකරනු ලබන බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

15. ඉහත කරුණු ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කරනු ලබන අතර මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන සිදුකර ප්‍රගතිය වාර්තා කිරීමට හා මෙම සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අනාවරණය කර ගැනීමෙන් අනතුරුව අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා වෙනත් දිනයක් ලබාදෙන ලෙසත්, මෙම නඩුකරය අධිකරණයේ ආරක්ෂිත සෙප්පුවේ සුරක්ෂිතව තබන ලෙසට ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

29

විමර්ශන නිලධාරි,
උ.පො.ප. හේෂාන්

ස්ථානාධිපති,
මිනීමැරුම් විමර්ශන අංශය,
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

නඩුව කැඳවන දිනය - 2024.08. 29

ඩී. කේ. ඉන්දුක ද සිල්වා
ප්‍රධාන පොලිස් පරීක්ෂක
ස්ථානාධිපති
මිනීමැරුම් විමර්ශන අංශය
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
කොළඹ 01

Copy

විමර්ශනයේ ප්‍රගතිය වාර්තා කරමින් අධිකරණ නියෝග ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම.

H 027655 – 10,000 (2006/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව පොලිස් / பொலிஸ் } 55

(F2 Orig. & Dup. S. & T.) 05/80

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.

මිනිමැරුම් විමර්ශන අංශය.

2024/01/15

ශ්‍රී ලංකා පොලිසිය/இலங்கைப் பொலிஸ்

**මහෙස්ත්‍රාත්වරයා වෙත සැපයෙන තොරතුරු**

**நீதிவானுக்கு வழங்கப்படும் தகவல்**

තො. පො. පිටුව / த. ர. பக்கம் } C 298/24/ CM

තො. පො. ඡේදය / த. எ. பந்தி }

අධිකරණය / நீதிமன்றம் } කොටුව මහේස්ත්‍රාත්

ස්ථාන අංකය : අ. වා. ලේ. / நிலைய இல. : குற்றம் சாட்டத்தக்க குற்றப் பதிவேடு }

නඩුවේ අංකය / வழக்கு இல. } B 34097/2024

අ. තො. ව. වා. ලේ. / குற்றமேற்றத்தகாத மற்றைய குற்றங்களின் பதிவேடு }

**1970 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ XI වැනි පරිච්ඡේදයේ**
**115 (1), (2), (3), (4), 120 (1), (2), (3) වැනි වගන්ති යටතේ**
**වරදක් විමර්ශනය කිරීමේ වාර්තාව**

**தண்டனை சட்ட நடவடிக்கை முறை பற்றி தேசிய அரசுப் பேரவையினது 1979 ஆம் ஆண்டின் 15 ஆம் இலக்க**
**குற்றவியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவைச் சட்டத்தின் 115 (1), (2), (3), (4),**
**120 (1), (2), (3) ஆகிய பிரிவுகளின் கீழான அறிக்கை**

කොටුව ගරු.

**මහෙස්ත්‍රාත්වරයා වෙතය,** පාස්කු ප්‍රහාරය හා සම්බන්ධයෙන් ලද බුද්ධි තොරතුර නිසි පරිදි විමර්ශන සිදු නොකිරීම
**நீதிவானுக்கு,** හේතුවෙන් පාස්කු ප්‍රහාරය සිදුව දේශිය ජාතිකයින් 232 ක් හා විදෙස් ජාතිකයින් 42 ක ප්‍රමාණයක් මියගොස් තවත් දේශිය ජාතිකයින් 564 ක් හා විදෙස් ජාතිකයින් 28 ක ප්‍රමාණයක් බරපතල තුවාල ලැබූ ........................ **බවට**

අංක.335/3.බී,.දේවාල.පාර,.කඩුවාන,.හෝමාගම........................ **පදිංචි**

ලේකම්.වසම්.පාලිත.රොෂාන්.සිරිවර්ධන........................ **විසින්**

2024.06.24........................**වැනි දින කරන ලද පැමිණිල්ල විභාග කළ බව** අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මිනිමැරුම් විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. ඩී.කේ.ඉන්දුක ද සිල්වා **වන මම මෙයින් වාර්තා කරමි.**

........................ என்னுமிடத்தைச் சேர்ந்த
........................ ஆகிய நான்
20........ஆம் ஆண்டு ................மாதம் ................நாளன்று ........................
என்னுமிடத்தைச் சேர்ந்த ........................என்பவர் செய்த ........................
........................
........................ என்ற பொருள்படும் முறைப்பாட்டினைப் பற்றி விசாரித்துள்ளேன் என இத்தால் அறிக்கையிடுகின்றேன்.

| | |
|---|---|
| පරීක්ෂණයේදී නිශ්චය කොට දැනගත් කරුණු සහ පැමිණිල්ල සනාථ කරන තවත් සාක්ෂි කරුවන් සිටිවෙතු වෙත් නම්, ඔවුන්ගේ සාක්ෂි / விசாரணையில் கண்டறியப்பட்ட நிகழ்வுகளும் முறைப்பாட்டுக்காதாரமாக மேலதிக சாட்சிகளின் சான்று ஏதேனும் இருப்பின் அதுவும் | ........................ |
| චූදිතයාගේ සාක්ෂිකරුවන්ගේ නම හා ලිපිනය සහ ඔවුන්ගේ සාක්ෂි කෙටියෙන්. / குற்றஞ்சாட்டப்பட்டவரினது சாட்சிகளின் பெயரும் முகவரியும் சுருக்கமாக அவர்களது சாட்சியமும். | කරුණාකර අනෙක් පිටුව බලනු මැනවි. → |
| චූදිතයා අධිකරණයට යවන ලද්දේ සිරභාරයේ ද නැතහොත් ඇප පිට ද යන වග, ඇප පිට නම්, ඇප මුදල් ඇපකරුවන් ප්‍රතිය / குற்றஞ்சாட்டப்பட்டவர் கட்டுக்காவலிலா அல்லது பிணையிலா விடப்பட்டுள்ளார் என்பது. பிணையிலாயின் பிணை முறிகள் இணைக்கப்பட வேண்டும். | ........................ |
| ඉදිරිපත් කෙරෙන දව්‍ය තිබේනම් අධිකරණය වෙත යවා ඇත්නම් ඒ පිළිබඳ ලැයිස්තුව / நீதிமன்றத்துக்கனுப்பப்பட்ட சான்றுப் பொருள்கள், ஏதேனும் இருப்பின் அவற்றின் நிரல் | ........................ |

........................

මෙම සිද්ධිය සම්බන්ධයෙන් මා විසින් මුල් වරට 2024.08.29 වන දින ගරු අධිකරණයට ඉදිරිපත් කරන ලද වැඩිදුර වාර්තාව හා බැඳේ.

02. 2019.04.09 වන දින රාජ්‍ය බුද්ධි සේවාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා වෙත පිටපතක් සහිතව ගරු පොලිස්පතිතුමා වෙත යොමු කරන ලද "අති රහස්‍යයි" යනුවෙන් සඳහන් බුද්ධි තොරතුරේ සඳහන් කරුණු සම්බන්ධයෙන් නිසි පරිදි විමර්ශනය නොකිරීම හේතුවෙන් 2019.04.21 වන දින පාස්කු ප්‍රහාරය සිදුව ඇති බවත්, එමගින් දෙස් විදෙස් ජාතිකයින් විශාල ප්‍රමාණයක් මියගොස් තවත් දෙස් විදෙස් ජාතිකයින් විශාල ප්‍රමාණයක් බරපතල තුවාල ලබා ඇති බවට, සඳහන් කරමින් විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති පාලිත සිරිවර්ධන මහතා විසින් 2024.06.24 වන දින පොලිස්පතිතුමා වෙත යොමු කරන ලද පැමිණිල්ලට අදාල ඉදිරි විමර්ශන කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මිනිමැරුම් විමර්ශන අංශය මගින් සිදුකරනු ලබන බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

03. මෙම ප්‍රහාරය හේතුවෙන් 2019.04.21 වන දින දිවයින පුරා පිහිටි කතෝලික පල්ලිවල ඉරුදින දේව මෙහෙයේ වන්දනා කරමින් සිටින ලද ක්‍රිස්තියානු බැතිමතුන්ද, දේශිය විදේශිය ජාතිකයින්ගේ මරමස්ථානයක් බවට පත්වූ කොළඹ ප්‍රදේශයේ ඉතා ප්‍රසිද්ධ හෝටල් වල මෙදින උදෑසන ආහාරය ලබා ගැනිම සඳහා පැමිණ සිටි <u>දේශිය විදේශිය ජාතිකයින් අතරින් විදේශකයින් 42 දෙනෙකු හා දේශිය පුද්ගලයින් 232 දෙනෙකු මෙම ප්‍රහාරයෙන් මියගොස් දේශිය පුද්ගලයින් 564 දෙනෙකු හා විදේශකයින් 28 දෙනෙකු බරපතල තුවාල ලබා ඇති බව වාර්තා කරමි.</u>

04. මෙම සිද්ධිය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදි විශ්‍රාමික පොලිස් පරීක්ෂක වාහල තන්ත්‍රිගේ ඩයස් පත්මසිරි නිලධාරියාගේ ප්‍රකාශයට අනුව පහත කරුණු අනාවරණය වී ඇති බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

<u>වාහල තන්ත්‍රිගේ ඩයස් පත්මසිරි. ( විශ්‍රාමික පොලිස් පරීක්ෂක ) තෙල්ටන්වත්ත, අඹගහකුඹුර පාර, දොඩන්ගොඩ.</u>

මොහු 1985.10.20 වන දින පොලිස් සේවයට බැදි 2018 දෙසැම්බර් මාසයේදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාණිජ අපරාධ විමර්ශන අංශ 1 ට අනුයුක්තව සේවය කල බවත්, 2018 දෙසැම්බර් මාසයේ දිනක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොරොත්තු සේවා රාජකාරි වාර්තා කර තිබියදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපතිතුමාගේ නියෝග පරිදි විශේෂ රාජකාරියක් සඳහා පොලිස් පරීක්ෂක ජානක මාරසිංහ මහතාට වාර්තා කරන ලෙසට නියෝග කල බවත්, ඒ අනුව මොහු සහ මොහු සමග පොරොත්තු සේවා රාජකාරි යෙදි සිටි අනෙක් නිලධාරින් කණ්ඩායම සමගින් පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා වෙත වාර්තා කිරිමෙන් පසුව මාරසිංහ මහතා විසින් කෑගල්ලේ විශේෂ විමර්ශනයක් යාම සඳහා සුදානම් වන ලෙසට දන්වා සිටි බවත්, ඒ අනුව කෑගල්ල ප්‍රදේශයට ගිය පසුව මාවනැල්ල සහ කෑගල්ල ප්‍රදේශ වල බුදු පිළිම කැඩිම සම්බන්ධව විමර්ශනයක් බවට දැනගත් බවත්, එම විමර්ශන කටයුතු සිදුකිරිමේදි මෙම සිද්ධියට සාදික් හා ශාහිඩ් යන සහෝදරයන් දෙදෙනා සම්බන්ධ බවට දැනගත් බවත්, පසුව මෙම සිද්ධියට සම්බන්ධ සැකකරුවන් 04 දෙනෙකු අත්අඩංගුවට ගැනිමෙන් පසුව රැදවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රදවා තබා ගනිමින් විමර්ශන සිදුකල බවත්, පසුව මෙම සැකකරුවන් වනාතවිල්ලුව ප්‍රදේශය වෙත සුදු පැහැති වෑන් රථයකින් ප්‍රවාහනය කල බවට අනාවරණය කර ගැනිමෙන් පසුව එම වෑන් රථය අත්අඩංගුවට ගැනිම සඳහා විමර්ශන සිදුකල බවත්, පසුව මෙම වෑන් රථය සම්බන්ධයෙන් සොයා බැලිමේදි අන්සාර් නැමති අයකු භාවිතා කරන බවට සොයාගැනිමෙන් අනතුරුව මෙම තැනැත්තා සහරාන් නැමැත්තාගේ බිරිඳගේ සහෝදරයා බවට අනාවරණය වු බවත්, ඉන් පසුව සහරාන් නැමැත්තා සම්බන්ධයෙන් ඔහු

පදිංචි ලිපිනයන් වෙත ගොස් පරීක්ෂා කලත්, ඔහු නිවෙස් වල හෝ පරීක්ෂා කල ලිපිනයන් වල නොසිටි බවත්, මොහු විසින් මෙම සියළු විමර්ශන ප්‍රගතිය පොලිස් පරීක්ෂක මාරසිංහ මහතාට දැනුවත් කල බවත්, මොහු විසින් සිදුකරන ලද සියළු විමර්ශන පොලිස් පරීක්ෂක මාරසිංහ නිලධාරියාගේ දැනුම්දීම මත සිදුකල බවත්. මෙම විමර්ශන කටයුතු මොහු විසින් සෙසු නිලධාරීන් කණ්ඩායමක් සමගින් සිදුකරන ලද අවස්ථාවේදී කිසිදු අවස්ථාවක සහරාන් හෝ ඔහුගේ පවුලේ අයවලුන් සම්බන්ධ කිසිදු සිදුවීමක් මොහු වෙත නොදැන්වූ බවට ප්‍රකාශ කර ඇත.

05. පූර්ව නඩු දිනයේදී ගොනු කරන ලද වැඩිදුර වාර්තාවේ 11 ඡේදයේ සඳහන් කරන ලද රාජ්‍ය බුද්ධි සේවාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් අවස්ථා කිහිපයකදී 2019.01.25 වන දින සිට 2019.04.20 වන දින දක්වා කාලය තුළදී " ජාතික තව්හීත් ජමාත්" නායක මොහොමඩ් සහරාන් සහ ඔහුගේ අනුගාමිකයින් විසින් මෙරට සිදුකරන ලද අන්තවාදී ක්‍රියා හා ඉදිරියේදී සිදුකිරීම සඳහා නියමිත අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් කරුණු ඇතුළත් ලිපි පොලිස්පතිතුමා වෙත හා පිටපත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනෙවිරත්න මහතා වෙත යොමු කර ඇතත් එම කිසිදු තොරතුරක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා විසින් හෝ අධ්‍යක්ෂව සිටි ශානි අබේසේකර මහතා විසින් මෙම සහරාන් නැමැත්තා සහ අන්ත්‍රවාදී ත්‍රස්තවාදී ක්‍රියාකාරකම සිදුකරන ලද කණ්ඩායම් සම්බන්ධයෙන් විමර්ශන සිදුකරන ලද නිලධාරීන් වෙත ලබා නොදුන් බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කර දැනට විශ්‍රාමිකව සිටින පොලිස් පරීක්ෂක වාහල තන්ත්‍රිගේ ධයස් පත්මසිරි නිලධාරියාගේ ප්‍රකාශය අනුව සනාථ වන බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

06. මෙම සිද්ධිය සම්බන්ධයෙන් පූර්ව නඩු දිනයේදී ගරු අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව 2024.08.29 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවි සෙනෙවිරත්න මහතා සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂව සිටි ශානි අබේසේකර මහතා විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් මොවුන් දෙදෙනා අත්අඩංගුවට ගැනීමෙන් වැළකී සිටීම සඳහා ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SC FR 241/24 දරන මූලික අයිතිවාසිකම් පෙත්සම ගොනුකර ඇති බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කර සිටිමි.

07. ඉහත සඳහන් SC FR 241/24 දරන පෙත්සමේ වගඋත්තරකරුවන් වශයෙන් මා ඇතුළු පහත සඳහන් අයවලුන් නම් කර ඇති බව වාර්තා කර සිටිමි.

I. හේෂාන් පෙරේරා. උප පොලිස් පරීක්ෂක, මිනිමැරුම් විමර්ශන අංශය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ 01.
II. ඩී.කේ. ඉන්දුක ද සිල්වා. ප්‍රධාන පොලිස් පරීක්ෂක, ස්ථානාධිපති, මිනිමැරුම් විමර්ශන අංශය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ 01.
III. නුවන් දන්තනාරයන මහතා. සහකාර පොලිස් අධිකාරි, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ 01.
IV. සම්පත් සේනාරත්න මහතා. ප්‍රධාන පොලිස් පරීක්ෂක, ස්ථානාධිපති, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ 01.
V. මංගල දෙහිදෙණිය මහතා . ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, අධ්‍යක්ෂ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ 01.
VI. රෝහාන් ප්‍රේමරත්න මහතා. නියෝජ්‍ය පොලිස්පති, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, කොළඹ 01.
VII. දේශබන්දු තෙන්නකෝන් මහතා. පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 01.

X. වියානි ගුණතිලක මහතා. ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, බත්තරමුල්ල.

XI. ටිරාන් අලස් මහතා. මහජන ආරක්ෂක අමාත්‍ය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය, බත්තරමුල්ල.

XII. ජෙනරාල් කමල් ගුණරත්න. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, බත්තරමුල්ල.

XIII. ගරු නීතිපතිතුමා, නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 01.

08. ඉහත සඳහන් SC FR 241/24 දරන පෙත්සම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පත්කර ඇති ගරු නීතිපති දෙපාර්තමේන්තුවේ අතිරේක සොලිසිටර් ජෙනරාල්තුමාගේ දැනුම්දීම මත ඒ මහතාගේ නිල මැදිරියට 2024.09.18 වන දින පැය 14.00 ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මා ඇතුළු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මංගල දෙහිදෙණිය , සහකාර පොලිස් අධිකාරී නුවන් පී දන්තනාරායන යන මහත්වරුන් සහ විමර්ශන නිලධාරි උප පොලිස් පරීක්ෂක හේෂාන් යන නිලධාරින් සමග ගොස් වගඋත්තරකරුවන්ගේ ප්‍රති පිළිතුරු හා නිරීක්ෂණ ගොනුකරමින් සාකච්ඡා කිරීමේදී මෙම විමර්ශන කටයුතු දැනට මූලික අදියරේ පසුවන බැවින් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කටයුතු කරන්නේනම් ඒ සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමා වෙත වාර්තා කර උපදෙස් ලබාගත යුතු බවට දන්වා ඇති බව වාර්තා කරමි.

09. මෙම පාස්කු ප්‍රහාරයට අදාලව සිද්ධිය සම්බන්ධ පැමිණිල්ල මා අධීක්ෂණය කරනු ලබන සහකාර පොලිස් අධිකාරි නුවන් පී දන්තනාරායන මහතා විසින් පොලිස්පතිතුමාගේ නියෝග පරිදි 2024.07.06 වන දින සටහන් කර ගනිමින් මෙම පැමිණිල්ලට අදාල ලේඛන සහකාර පොලිස් අධිකාරිතුමා විසින් ඉල්ලුම් කර ඇත. මෙම පැමිණිල්ල සටහන් කර ගැනීමෙන් අනතුරුව යොමු අංක E8/OUT/4173/24 යටතේ 2024.07.08 වන දාතමින් සහකාර පොලිස් අධිකාරි නුවන් පී දන්තනාරායන මහතා විසින් අධ්‍යක්ෂතුමා වෙත 'විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති පාලිත සිරිවර්ධන මහතාගේ ලිඛිත පැමිණිල්ලට හා වැඩිදුර ප්‍රකාශයට අනුව පූර්වගාමී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති D.W.R.B. සෙනෙවිරත්න මහතා ඇතුළු නිලධාරින් දැ.නි.ස. 289 එනම් "ව්‍යවස්ථාපිත යුතුකමක් ඕනෑවටම නොකර හැරීම" නිසා පොලිස් ආඥා පනතේ 56 (ඉ) "පොදු සාමය සම්බන්ධයෙන් ආරංචි එක්රැස් කිරීම හා ඒවා දැන්වීම"සහ (ඊ) "යම්කිසි බලධරයකු විසින් නීත්‍යානුකූලව නිකුත් කරනු ලැබූ සියළුම නියෝග හා වරෙන්තු තමා වෙත කරනු ලැබූ නියමය අනුව අප්‍රමාදව පිළිපැදීම ඉටු කිරීම" පැහැර හැරීම හේතුවෙන් දැ.නි.ස. 296 යටතේ වූ වරදක් සිදුවී ඇති බව බැලූ බැල්මට ගම්‍ය වන බව නිරීක්ෂණය වේ. යනුවෙන් සඳහන් වාර්තාවක් අධ්‍යක්ෂතුමා වෙත ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවේ පිටපත ඇමුණුම 1 වශයෙන් ඉදිරිපත් කරමි.

10. ඉහත වාර්තාව ඇතුළු මෙම නඩුවට අදාල විමර්ශනයේ වැදගත් ලේඛන ප්‍රමාණයක් මෙම නඩුවේ සැකකරුවන් බවට පත්වේයැයි මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනු කර ඇති පාර්ශවය පත්ව ඇති අතර ඔවුන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් පෙත්සම් අංක SC FR 241/24 දරන පෙත්සමෙ ඇමුණුම් වශයෙන් එම ලේඛන ඉදිරිපත් කර ඇති බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කරමි.

11. මේ වන විට මෙම පැමිණිල්ලට අදාලව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිව සිටි D.W.R.B. සෙනෙවිරත්න මහතා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමා වශයෙන් පත්ව සිටින හෙයින් මේ වන විට 2024.09.23 වන දින සිට කිසිදු විමර්ශනයක් සිදුකර නොමැති අතර මෙම තත්වය මත සහකාර පොලිස් අධිකාරි නුවන් පී දන්තනාරායන මහතාට පිටත ස්ථාන මාරුවීමක් ලැබුණහොත් නිවසේ සිට රාජකාරි සඳහා පැමිණීමට නොහැකි වන බැවින් නීතිපතිතුමාගේ සාකච්ඡාවේදී ලබාදුන් උපදෙස් කිරීම සඳහා කටයුතු කලහොත් ස්ථාන මාරුවීම ලැබීමට සිදුවන බව ඒ මහතා විසින් මා හට සහ විමර්ශන නිලධාරි උප පොලිස් පරීක්ෂක හේෂාන් නිලධාරියාට දන්වා සිටීම ඒ හේතුවෙන් මෙම විමර්ශනය අධීක්ෂණය කරනු ලබන සහ මිනිමැරුම් විමර්ශන අංශය අධීක්ෂණය කරනු ලබන නිලධාරියා වශයෙන් කටයුතු කරනු ලැබුවද නිලධාරියා

ඔහුගේ පෞද්ගලිත්වය වෙනුවෙන් කටයුතු කරමින් මෙම විමර්ශන කටයුතු වලින් මගහැර ඇති බව වාර්තා කරමි.

12. මෙම විමර්ශනය සම්බන්ධයෙන් 2024.09.18 වන දින ගරු නීතිපතිතුමා විසින් ලබාදෙන ලද උපදෙස් මා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මිනිමැරුම් විමර්ශන අංශයේ දෛනික තොරතුරු සටහන් පොතේ ඇතුළත් කර ඇති අතර සහකාර පොලිස් අධිකාරි නුවන් පී දන්තනාරායන මහතා විසින් උසස් නිලධාරින්ගේ ගමන් සටහන් පොතේ සටහන් යොදා ඇති අතර මෙම විමර්ශනය සම්බන්ධයෙන් ඉදිරි නීතිමය උපදෙස් ලබා ගනිමින් විමර්ශන කටයුතු සිදුකල යුතු බැවින් අධ්‍යක්ෂතුමාගේ අත්සනින් යුතුව ගරු නීතිපතිතුමා වෙත 2024.09.19 වන දින වාර්තාවක් යොමු කරමින් විමර්ශන නිලධාරින් වෙත ඉදිරි විමර්ශන කටයුතු සිදුකිරීම සඳහා උපදෙස් ලබාදීමට රජයේ අධිනීතිඥවරයෙකුගේ සහය ලබාදෙන ලෙසට ඉල්ලීම කර ඇති බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කරමි.

13. මෙම සිද්ධියට සම්බන්ධයෙන් මාධ්‍යවේදි තරිදු ජයවර්ධන විසින් MediaLK නැමති Youtube මාධ්‍ය ජාලය මගින් මෙම විමර්ශනයට හාදා වන ආකාරයෙන් සම්පූර්ණ අසත්‍ය කරුණු ඇතුළත් වීඩියෝ දර්ශන දිගින් දිගටම සමාජ මාධ්‍ය ජාලය තුළින් සමාජයට මුදාහැර ඇති බැවින් ශ්‍රී ලාංකිකයන්ට මෙන්ම විදේශගතව සිටින ශ්‍රී ලාංකික ජනතාවද නොමග යවන කරුණු ජනගත කිරීම සිදුකරන බව ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කරනු ලබන අතර මාධ්‍යවේදි තරිදු ජයවර්ධන විසින් 2024.10.03 වන දින සිදුකරන ලද වීඩියෝ පටයේ පහත සඳහන් කරුණු අන්තර්ගතව ඇති බව වාර්තා කරමි.

**MediaLK Youtube නාලිකාවෙන් මාධ්‍ය වේදී තරිඳු ජයවර්ධන විසින් සමාජ මාධ්‍යට මුදා හරින ලද වීඩියෝ දර්ශනයේ ඇතුලත් ප්‍රකාශය.**

අපි ඊයේ කතා කලා වැඩ බලන පොලිස්පතිවරයාගේ පත්වීම ගැන. වැඩ බලන පොලිස්පතිවරයාගේ පත්වීම ගැන වගේම තවත් පත්වීමක් ගැන මේ වන විට ලොකු කතා බහක් ඇතිවෙලා තියෙනවා. ඒ මහජන ආරක්ෂක අමාත්‍යාංශය එහෙම නැත්නම් ශ්‍රී ලංකා පොලීසිය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පත්වීම මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විදිහට පත්කරලා තියෙන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහත්මයා. ඔහුගේ පත්වීම ගැන මේ වෙනකොට ලොකු සාකච්ඡාවක් ඇතිවෙලා තියෙනවා. ඒ තමා විශ්‍රාමිකයෙක් තනතුරකට පත් කිරීම, ඊට පස්සේ ඔහුට විරුද්ධව තියෙන චෝදනා, ඊට පස්සේ ඔහුගේ සුදුසුකම් මේ වගේ දේවල් ගැන මේ වන විට විවිධ පාර්ශවයන් මේ වනකොට ප්‍රශ්න කරමින් ඉන්නවා. අද වීඩියෝ එක කරන්න බලාපොරොත්තු වෙන්නේ රවී සෙනෙවිරත්නගේ පත්වීම සම්බන්ධයෙන්, MediaLK Youtube නාලිකාව සබ්ස්ක්‍රයිබ් කරලා නැත්නම් සබ්ස්ක්‍රයිබ් කරන්න කියලත් මතක් කරනවා. ඒ වගේම MediaLK එකට සහයෝගය දක්වන්න කැමති නම් තොරතුරු ලබදෙන්න. එහෙම නම් අපි අද මාතෘකාවට එමු. අද මාතෘකාව කලින් කිව්වා වගේම රවී. 2015 යහපාලන ආණ්ඩු කාලයේ රවීලා තුන්නෙක් ගැන කතාබහ වුණා. විවිධ හේතු නිසා එක්කෙනෙක් රවී කරුණානායක බැදුම්කර සිද්ධියත් එක්ක බොහෝ කතා බහට ලක්වුණා. අනෙත් එක්කෙනා රවී වෛද්‍යලංකාර පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය යහපාලන ආණ්ඩු කාලයේ අළුතින්ම පත් කරපු FCID එක භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා උනේ රවී වෛද්‍යලංකාර. ඔහුගේ ක්‍රියාකලාපයත් සැහෙන්ට කතා බහාට ලක්වුණා. ඊලගට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න. ඔහු ගැනත් ඇත්තටම යම් කතා බහක් තිබුණා. ඒ තිබ්බේ මොනවද කියලා මම කියන්නම් එතකොට අපි අද කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ මේ රවී සෙනෙවිරත්නගේ පත්වීම සම්බන්ධයෙන්. රවී සෙනෙවිරත්න නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු විදිහට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරව ඉන්නේ 2012 හෝ 2013 ඔහු ඊට කලින් විවිධ ප්‍රදේශවල සේවය කරලා තියෙනවා. පොලිස් විශේෂ කාර්ය බලකායේ දීර්ඝ කාලයක් සේවය කරලා

තියෙනවා. ඉන් පස්සේ නවත් තැන්වල සේවය කරලා රාජ්‍ය බුද්ධි SIS එකේ රාජ්‍ය බුද්ධි සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරලා තියෙනවා. ඒ විදිහට විවිධ තැන්වල රාජකාරි කරලා අවසානයේ ඔහු 2012 හෝ 2013 මං හිතන්නේ 2012 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විදිහට පත්වෙනවා. ඔහු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධූරයට උසස් වීම ලබනවා 2015 වර්ෂයේදී. එතැන් සිට 2012 සිට 2019 දෙසැම්බර් 31 වෙනකන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එහෙම නැත්නම් රහස් පොලීසිය එහෙම නැත්නම් CID එක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස කටයුතු කරමින් ඉන්නවා. ඔහු ඒ අතරතුර කාලයේ FCID එක භාරව සිටි වෛද්‍යාලංකාර එතනින් ගියාට පස්සේ FCID එක භාරව හිටියා. ඊට අමතරව TID එක ත්‍රස්තවාදි ක්‍රියා වැලැක්වීමේ කොට්ඨාසය TID එකේ භාරව කාලයක් කටයුතු කලා ඒ කියන්නේ CID එකට අමතරව. ඒ කියන්නේ CID එක භාරව ඉද්දි මේ දෙකම භාරව කාලයක් කටයුතු කලා. ඔහුව ප්‍රසිද්ධ උනේ 2015දී විවිධ හේතූන් නිසා ප්‍රසිද්ධියට පත්වුණා. FCID එක ඔහු භාරයට දුන්නට පස්සේ ඔහු යනවා FCID එකට ඔහු ඒක අධීක්ෂණය කරන්න. ඔහු එක් අධීක්ෂණය කරනන් යන අවස්ථාවේදී ඒ කියන්නේ පළවෙනි අවස්ථාව යද්දී ඔහු දකිනවා යද්දිම ඉස්සරහ ලොකු බුදු පිළිමයක් තියලා තියෙනවා FCID එකේ. එතකොට FCID එක කියන්නේ රාජ්‍ය ආයතනයක්. දෙපාර්තමේන්තු නියෝග අනුව එහෙම ආගමික් සංකේත තියන්න බෑ. මොකද හේතුව FCID එක වගේ ආයතනයකට සෑහෙන්න පිරිසක් එනවා හැම ආගමකම කට්ටිය එන එක පාරට ඒගොල්ලන්ට අදහසක් එන්න බෑ. මෙක මේ එක පැත්ත කට්ටියකට පක්ෂව වැඩ කරන එහෙම තැනක් කියලා අදහසක් එන්න බෑ. ඒ නිසා රවී සෙනෙවිරත්න වහාම එම බුදු පිළිමය එතැනින් ඉවත් කරලා වෙන තැනක තියන්න කියලා නියෝගයක් නිකුත් කරනවා ඒ අනුව තියනවා. ඔහුගෙන් ඒ කාලේ මේ ගැන ඇහුවම ඔහු කිව්වේ අපිත් බෞද්ධ තමා අපි ගෙදර දාන පින්කම් කරනවා කරන්න ඕන හැම එකක්ම කරනවා. හැබැයි අපි රාජකාරිය කරන්නේ රාජකාරිය විදිහට රාජකාරිය කරද්දි පේන්න බෑ කාටවත් අපි අහවල් ආගමකට අහවල් ජාතියකට පුද්ගලයන්ට පක්ෂපාතිව සලකනවා කියලා පේන්න බෑ. අපේ හැම වැඩක්ම අපක්ෂපාතී වෙන්න ඕන. ඒ නිසා ආගම කියන එක බුදුපිළිමය කියන එක එලියේ පේන්න තියන්න ඕන නෑ අපේ හදවතේ තිබ්බහම ඇති. අපි ගෙදරදී අපි එතනින් පිටදී අපි එතනින් පිටදී අපි ධර්මානුකූලව හැසිරෙනවා. අපි ඇතුලෙදිත් ධර්මානුකූලව හැසිරෙනවා. එලියේ පේන්න මේවා තියන්න ඕන් නෑ. ඒක තමා ඔහුගේ අදහසත් එක්ක ඔහු ගැන සෑහෙන කතාබහකට ලක්වුණා. ඒ කියන්නේ ඔහුව සෑහෙන්ට හොඳ චරිතයක් විදිහට තමා කතාබහට ලක්වුනේ. ඒ වගේම තමා ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉන්න කාලේ ඔහු යටතේ තමා ශානි අබේසේකරලා විමර්ශන කලේ. ශානි අබේසේකර ප්‍රසිද්ධියේ කියන කාරණයක් තමා ඔය අබේසේකරට ඔහුගේ කණ්ඩායමට ස්වාධීනව හරියට විමර්ශන කරගෙන යන්න තිබ්බ ශක්තිය තමා රවී සෙනෙවිරත්න කියලා. ඒකට හේතුව තමා බැදුම්කර සිද්ධිය වෙනත් සිද්ධි හැම අවස්ථාවකදීම රවි කියලා තිබ්බේ ඔයාලා ඔයාලට ඕන විදිහට වැඩ කරගෙන යන්න. මං බලපෑමක් කරන් නෑ. එලියෙන් එන බලපෑම් මං බලාගන්නම් කියලා. ඒකට හොදම උදාහරණය අපිත් එකට විරුද්ධව වැඩ කරපු අවස්ථාවක්. ඒ තමා 2018 දින 52 ආණ්ඩුව කාලේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙ හිටපු පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මාරු කරනවා අත්තනෝමතික විදිහට එකපාරට CID එකෙන් ඉවත් කරලා වෙන තැනකට දානවා මං හිතන්නේ මීගමුවට දානවා. ඒ වෙලාවේ ශානි අබේසේකර වගේම රවි සෙනෙවිරත්නත් දැඩිව නිශාන්ත සිල්වා වෙනුවෙන් පෙනී හිටියේ මාරුවීම වැරදියි කියලා කිව්වා වැරදියි කියලා ලිව්වා. අපිත් ඒකට සම්බන්ධ අපි පොලිස් කොමිෂන් සභාවට පොලිස්පතිට ලිව්වා ඒ වැරදි ස්ථාන මාරුවක් එය නිවැරදි කරන්න කියලා. රවි සෙනෙවිරත්නත් ඒ තමන්ගේ නිලධාරියා වැරදි විදියට ස්ථාන මාරුවීම් කළහම ඒ වෙනුවෙන් පෙනී හිටියා. තවත් ඒ වගේ උදහරණ ඕන තරම තියනවා. රාජපක්ෂලාගේ වංචා දූෂණ ඒවා සම්බන්ධයෙන් එයා විමර්ශනය කරන්න ඉඩ දීලා තිබ්බා. විමර්ශන කරන්න සහයෝගය දුන්නා. තවත් එකම හොද උදාහරණයක් ගෝඨාභය රාජපක්ෂගේ කට උත්තරය ගන්න වෙලාවේ ගෝඨාභය රාජපක්ෂ ශානි අබේසේකරලා නිශාන්ත සිල්වලා පොලිස්

පරික්ෂක නිශාන්ත සිල්වා අහනවා එක සිදුවීමක් ගැන ඒ සිදුවීම ඇහුව ගමන් එයා මුත්‍රා කරන්න යන්න ඕන කියලා එතනින් ඊට පස්සේ ඒක ඉවර වෙලා රවී සෙනෙවිරත්න හම්බ වෙලා මාව හිර කරන්නද හදන්නේ මොක්කද ඒ වගේ අහලා තිබ්බා. රවී කෙලින්ම කියලා තිබ්බා ඒගොල්ලෝ කරන්නේ විමර්ශන ඒගොල්ලලොන්ට සහාය වෙන්න කියලා. එතකොට ඒ විදිහට ඒ කාලේ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ අවසාන කාලයේ හොඳට වැඩ කරමින් හිටපු නිලධාරියෙක්. ඔහුගේ ඔහු විශ්‍රාම වයස ආවා විශ්‍රාම වයස ආපුවාම ඒ අවස්ථාවේදී ඔහු පාස්කු විමර්ශන අධීක්ෂණය කරමින් හිටපු නිසා ඒ ආණ්ඩුව ඔහුට මාස හයක සේවා දිගුවක් දුන්නා. ඒ මාස හයක සේවා දිගුව 2019 ඉවර උනා. 2019 දෙසැම්බර් 31 ඒ කියන්නේ එතකොට ගෝඨාභය ඇවිල්ලා මාසයයි. ඒ අනුව ඔහු සේවයෙන් විශ්‍රාම ගියා. ඒ වගේම තමා ශානි අබේසේකරව අත්තනෝමතික විදිහට 2020 මහ මැතිවරණයට දින පහක් තිබියදී 2020 අගෝස්තු මස 31 වෙනිදා ජූලි මස 31 වෙනිදා ශානි අබේසේකරව කොළඹ අපරාධ කොට්ඨාසයෙන් අත්අඩංගුවට ගත් අවස්ථාවේ මම ඇත්තට ඔහුට කතා කරලා ශානිව ඇරෙස්ට් කරලාද කියලා ඇහුවාම තමා ඔහු දැනගත්තේ ශානිව ඇරෙස්ට් කරලා කියලා. ඒ අවස්ථාවේ සිට මාස 10යි දවස් ගානක් ශානි ඇතුලේ තියලා තිබිලා එලියට එනකම්ම හැමදාම උසාවි ගියා. හැමදාම උසාවි ගියා. නීතිඥවරු ගාවට ගියා. පවුලේ සුභසාධනය ගැන හොයලා බැලුවා. කෑම බීම ගැන හොයලා බැලුවා. ශානිගේ සමහර වැඩ වලට මුදල් වියදම් කලා. මේ බොහෝ දේවල් කලා. ශානි අබේසේකරට ඒ තමන් යටතේ හිටපු නිලධාරියෙක් වෙනුවෙන්. එහෙම කලේ. ඔය පළවෙනි පලවෙනි අවස්ථාවේ මෙ ශානිව ඇරෙස්ට් කරලා මහේස්ත්‍රාත්ගේ නිල නිවසට ශානිව ගෙනියද්දි ඒ අවස්ථාවේදී කවුද රවී සෙනෙවිරත්න එතැනට ගියාට පස්සේ ඒ ආණ්ඩුවේ ප්‍රහලයෙක් ප්‍රහල නිලධාරියෙක් කෝල් කරලා අහලා තිබ්බා ඇයි ඔයා ගියේ ඔහු කියලා තිබ්බා මං යටතේ හිටපු නිලධාරියෙක් ශානි වරදක් කරලා නම් මාත් එකට වග කියන්න ඕන. ඒ නිසා මාත් යනවා. ඔහු එහෙම උත්තර දීලා තිබ්බා. ඉතිං සෙනෙවිරත්න ඒ කාලේ හොඳ නිලධාරියෙක් විදියට ප්‍රසිද්ධ වෙලා හිටියා. දැන් අපි මේ අදාල මාතෘකාවට එමු. රවී සෙනෙවිරත්නව පත්කරපු එක රවී සෙනෙවිරත්නගේ පත්වීම ගැන චෝදනා කරන කට්ටිය ගැන එක චෝදනාවක් තමා ඔහු දැන් විශ්‍රාමිකයි ඒ නිසා ඔහු සුසුදු නෑ කියලා. මම පෞද්ගලිකව විශ්‍රාමිකයෝ මේ වගේ තනතුරු වලට පත්කිරීමට විරුද්ධයි. ඒ අර්ථයෙන් ගත්තොත් එහෙම රවී සෙනෙවිරත්නව මහජන ආරක්ෂක අමාත්‍යංශය ලේකම් විදිහට පත් කරපු එකට මං විරුද්ධයි හේතුව තමා ඔහු විශ්‍රාම ගිහිල්ලා ඉවරයි. විශ්‍රාමික නිලධාරීන්ගේ සේවය අනිවාර්යෙන්ම ආණ්ඩුවකට එහෙම නැත්නම් අපේ රාජ්‍ය නිලධාරින්ට ලබාගැනීමේ හැකියාව තිබෙනවා. ඒ මේ වගේ තනතුරු වලට නෙමෙයි කියලා තමා මම විශ්වාස කරන්නේ. මොකද ලංකාවේ සක්‍රීය රාජ්‍ය සේවයේ අවංක දක්ෂ නිලධාරින් ඕන තරම් ඉන්නවා. ඒ අවංක දක්ෂ නිලධාරින්ට තැන දෙන්න ඕනා. විශ්‍රාම ගියපු කෙනෙක් තනතුරකට පත් කළාම වෙන්නේ? අර තියෙන කෙනාට ඒ තනතුරට ඒමේ අවස්ථාව නැතුව යනවා. ඒ අර්ථයෙන් ගත්තොත් එහෙම විශ්‍රාම ගියපු මේ රවී සෙනෙවිරත්න මහත්මයා පත් කරාට මං විරුද්ධයි. හැබැයි අනිත් චෝදනා සම්බන්ධයෙන් අපි ඊළඟ සලකලා බලමු. එතකොට විශ්‍රාම ගියපු එක්කෙනෙක් පත්කරපු එක සමහරුන්ට හරියි කියන්න පුලුවන් සමහරුන්ට වැරදි කියන්න පුලුවන්. දෙපැත්තටම තියනවා. බොහෝ දෙනෙක් කියනවා ඇත්තටම මේක ප්‍රශ්නයක් නෑ ඇත්තටම මේ අවසථාවේ රවී තමයි ඉන්න ඕන කියලා. මම පුද්ගලිකව හිතනවා රවී ඉන්න ඕන. හැබැයි රවී විශ්‍රාමික නිසා එතැන්ට ඕනේ නෑ කියලා.ඒක එතකොට විවාදප්පන්න තත්වයක්. ඊලගට ඔහුට විරුද්ධව තියෙන චෝදනා. පලවෙනියට තියෙන චෝදනාව පළවෙනි චෝදනාව තමා පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට ඔහු අපොහොසත් වුණා. කාරනා දෙකකින් ඒ චෝදනාව වෙනවා. ඒ තමා නිලන්ත ජයවර්ධන අන්තිම මොහොතේ ඒ කියන්නේ ප්‍රහාරයට පැය කිහිපයකට කලින් ඔහුට තොරතුරු දෙනවා. ඔහු ඒක අවශ්‍ය තැන්වලට දැනුම් දුන් නැහැ කියලා චෝදනාවක් තියනවා. අනිත් එක තමා නිලන්ත ජයවර්ධන 2019 අප්‍රේල් මාසයේ නව වෙනිදා මොහුට ලිපියක් එවනවා මෙ අනතුරු ඇඟවීම ගැන. ඒ ලිපිය අනුව ක්‍රියා කලේ නෑ කියලා ඔහුට විරුද්ධව චෝදනාවක් තියනවා. මෙ චෝදනා දෙක මොහුට තියෙන්නේ. මොනවද මේ චෝදනා කවුද කොහොමද මේවා එන්නේ මුලින්ම ගත්තොත්

එහෙම රවී සෙනවිරත්න මහත්මයා සම්බන්ධයෙන් පාස්කු ප්‍රහාරයේ වෙන්න ඉඩ හැරියා හෝ වගේ දේවල් කියලා ඔහුට විරුද්ධව යහපාලන ආණ්ඩුව පෙරලිලා ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති උනාට පස්සේ විමර්ශනයක් පටන් ගත්තා. නිර්නාමික පෙත්සමක් මත. නිර්නාමික පෙත්සම් එතකොට නිර්නාමික පෙත්සම් එන්න ගත්තා. එතකොට ඒ නිර්නාමික පෙත්සමක් මත විමර්ශන පටන් අරගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කරලා දැනුම් දෙනවා ඒ තිබ්බ චෝදනා අසාධාරණ බොරු චෝදනා ඔවුන් හරියට ශානිලා රවිලා වැඩ කැරලා තියනවා කියලා. එතනින් පස්සේ නැවත කුලියාපිටිය පැත්තේ සිද්ධියක් ගැන ඒ කියන්නේ කුලියාපිටියේ නිවසේ හාදියාගේ නිවසේ කැකුණගොල්ල නිවසට සහරාන් ආවා සහරාන්ව ඒ වෙලාවේ CID එකේ විමර්ශන කණ්ඩායමක් ඒ ගෙදරට ගියා. ඔවුන්ට එතනින් යනන් කියලා ශානි සහ රවී ඇතුලු පිරිසක් නියෝග කලා ඒ නිසා ඔවුන් ගියා ඒ නිසා සහරාන්ව අල්ල ගන්න බැරි උනා කියලා චෝදනාවක් ගෙනාවා. ඒකට විරුද්ධව කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ කරුණු දැක්වීමකුත් කලා. ඒක අසාදාරන විදිහට තමන් අත්අඩංගුවට ගන්න යනවා කියලා ඒක වලක්වාලමින් වලක්වාලන නියෝගයක් ශානි අබේසේකර සහ රවී සෙනෙවිරත්න ගියා ශ්‍රේෂ්ඨාධිකරණයට. කොහොම හරි ඇත්ත කතාව එතකොට ඒ චෝදනාවට අදාලව ගත්තොත් එහෙම ශානි අබේසේකර අපි එතනින් පටන් ගමු ශානි අබේසේකර සහ රවී සෙනෙවිරත්න එහෙම කිසිම නියෝගයක් දීලා නෑ. කුලියාපිටියේ නිවසට ඔය කියන දවසේ සහරාන් ඇවිල්ලත් නෑ. හාදියා පළවෙනි වතාවට දුන්න කටඋත්තරේ අම්පාර පොලීසියට දුන්න කට උත්තරේ පවා තියනවා එතැනිට එයා ආවේ නෑ කියලා එදා. පස්සේ දුන්න කටඋත්තර වලත් තියනවා. එතකොට ඒක සම්පූර්ණ අසාධාරණ ඔවුන්ව කොටු කරන්න හදන චෝදනාවක් බවට පත්වෙලා තියනවා මේ වන විට ඊලගට තියෙන චෝදනාව තමා සිද්ධිය වෙච්ච දවසේ උදේ 2019 අප්‍රේල් 21 උදේ ඔහුට රවී සෙනෙවිරත්නට තොරතුරු දුන්න නිලන්ත ජයවර්ධන ඒක නවත්ත ගත්තේ නෑ කියලා. ඒ චෝදනාව ගැන කතා කලොත් එහෙම මේ සිද්ධිය වෙච්ච දවසේ උදේ හයයි ගානට විතර මම හිතන්නේ නිලන්ත ජයවර්ධන රවී සෙනෙවිරත්නට මැසේජ් එකක් එවලා තියනවා. මෙච්චර මේ අද බෝම්බ ප්‍රහාරයක් එල්ල වෙනවා සහරාන් අද ගහනවා කියලා ඔහු පණිවිඩය ඔහු නිලන්ත ජයවර්ධන මැසේජ් එකක් තමයි එවන්නේ. මං හිතන්නේ වට්ස්ඇප් මැසේජ් එකක් තමා එවලා තිබ්බේ. රවී සෙනෙවිරත්න පෝල් එක බලලා තියෙන්නේ එදා ඉරිදා නිවාඩු දවසක් පාස්කු ඉරිදා. පෝන් එක අතට අරන් බලලා තියෙන්නේ ප්‍රහාරයෙන් පස්සේ. එතකොට ඒකේ වරද රවීගේ නෙමෙ ඒකේ වරද නිලන්තගේ. මෙච්චර දරුණු එකක් ඇයි නිකං මැසේජ් එකක් එවලා නිකං හිටියේ. ඇයි කතා කරලාවත් කිව්වේ නැත්තේ. ඊලග චෝදනාව තමා නිලන්ත ජයවර්ධන දැන් මං මේ කියන්න කියන චෝදනාව එන්නේ රවී සෙනෙවිරත්න ඇතුළු පිරිස මාලිමාවේ පොලිස් සාම්බුලිකයක් නිර්මාණය කලා. නිර්මානය කලාට පස්සේ දවසේ ඔබට මතක ඇති මාධ්‍ය සාකාච්ඡාවක් තිබ්බා හිටපු පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු ලංකාවේ වැඩිපුරම චෝදනා වලට ලක්වෙච්ච පුද්ගලයෙක්. පොලිස් කොමසමේ ඉද්දි ගෝඨාභය රාජපක්ෂව පිලිගන්න ගියා කියලා වගේ විවිධ චෝදනා ආවා. ඔහු ඇතුළු පාලිත සිරිවර්ධන ඇතුලු පිරිසක් මේ මාධ්‍ය සාකාච්ඡාව තිබ්බා. ඒ මාධ්‍ය සාකාච්ඡාවේදී රවීට සහ ශානිට චෝදනා එල්ල කලා. ඉන් පස්සේ අපේ හිතවත් නියෝජ්‍ය පොලිස්පති පාලිත සිරිවර්ධන ඔබට මතක ඇති මීඩියාවලට ඇවිත් පාස්කු ගැන අපිත් එක්ක කතාබහකුත් කලා. පාලිත සිරිවර්ධන 2024.06.24 දිනැතිව පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්ට ලිපියක් යොමු කරනවා. පැමිණිල්ලක් යොමු කරනවා. ඒ පැමිණිල්ලේ 04 වන ඡේදේ මෙහෙම තියනවා " ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ ඒ කියන්නේ රවී සෙනෙවිරත්න වෙත ලැබී තිබූ ලිපිය ඔහු භාරයේ තබාගෙන පාස්කු ප්‍රහාරයෙන් පසු විමර්ශන කරන ලෙසට 2019.04.22 උපදෙස් ලබා දී තිබීම මා පුදුමයට පත්විමි. මෙමලිපිය පිලිබදව එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස කටයුතු කල රවී සෙනෙවිරත්න විසින් ජනාධිපති කොමිසම් සභාවට ලබා දී ඇති සාක්ෂියෙන් තහවුරු වේ. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව මගින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතාගෙන් සාක්ෂි

සෙනෙවිරත්නලා මේ ප්‍රහාරයට අදාලව සමහර දේවල් කරලා තියෙනවා පටන් අරන් තියෙනවා. 16 වෙනිදා පාලම්මුනෙ බයිසිකල් බෝම්බෙ ගැන රවී සෙනෙවිරත්න විමර්ශන පටන් අරන් තියනවා. හදිසියේ යම් යම් දේවල් හදිසි දේවල් කරලා තියෙනවා. මේකෙදි අදාල WPC ඊට පස්සේ ආපු නිවාඩු දවස් දෙකක් තිබ්බා හින්දා නැවත වතාවක් නිවාඩු දවස් අවාට පස්සේ WPC කරන්නේ ඒ ලියුම enter කරලා තියෙනවා අනිත් තැනට යවන් නැතුව එතකොට බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ නිවාඩු කැන්සල් කරපු හින්දා ඇය එනවා. ඇය ඇවිල්ලා නියෝජ්‍ය පොලිස්පතිට ඒ කියනනේ රවී සෙනෙවිරත්නට පහළ නිලධාරියාට යවනවා. එතකොට ඒක තමයි ඇත්තටම අනාවරණය වෙන්නේ. රවී සෙනෙවිරත්න වරදක් කලා කියලා අනාවරණය වෙලා නෑ මේකේ. මේක මේ රවී සෙනෙවිරත්න එන්න කලින් කරපු විමර්ශනයක්. ඡන්දෙට කලින් කරපු විමර්ශනයක්. ඒ විමර්ශනය අනුව එතකොට මේක ඇත්තටම මේ විමර්ශනයේ ප්‍රගතිය සම්බන්ධයෙන් අදාළ ඒක අධීක්ෂණ නිලධාරියා මේ රවී කවුද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සොරි අධ්‍යක්ෂ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දීලා තියනවා ලිඛිතව. ඕක තමයි එතකොට විමර්ශනයේ තත්වය. ඒ කියන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පාලිත සිරිවර්ධන මහතාගේ පැමිණිල්ල සම්බන්ධයෙන් කල විමර්ශනයේදීත් අනාවරණය වෙලා තියෙන්නේ අර කාරණාවම තමා. ඔහුට විරුද්ධව චෝදනාවක් ඒකට අදාලව නෑ කියලා. දැන් චෝදනා වලට අදාල උත්තර ඒක. දැන් රවී සෙනෙවිරත්න කොහොම හරි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විදිහට පත්වෙලා තියෙනවා. මම හිතන්නේ අනුර කුමාර දිසානායකටත් වැඩිය අභියෝගයකට ඔහු මුහුණ දෙනවා. ඒ තමා ලංකාවේ දූෂිතම ආයතනය දෙකක් විදිහට සැලකෙන මහජන ආරක්ෂක අමාත්‍යාංශ සැලකෙන ශ්‍රී ලංකා පොලිසිය සහ ආගමන විගමන දෙපාර්තමේන්තුව කියන ආයතන දෙකම. රවී සෙනෙවිරත්න මහතාට තමා භාරව තියෙන්නේ. එතකොට මේ ආයතන දෙක හොද තැනකට ගෙන ඒ මේ වගකීම ඔහුට තියනවා. පහුගිය කාලේ වඩාත්ම කතාබහට ලක්වෙච්ච වීසා ගණුදෙණුව, පාස්පෝට් ගණුදෙණුව මේ ඔක්කෝම තියෙන්නේ රවී සෙනෙවිරත්නගේ අමාත්‍යාංශ යටතේ වෙච්ච දේවල්. එතකොට රවී සෙනෙවිරත්නට ඒවාට අදාලව නීතිය ක්‍රියාත්මක කිරීම ලොකු වගකීමක් තියනවා. අනිත් පැත්තෙන් බලද්දි පොලීසිය දේශපාලනීයකරණය වෙච්ච දේශපාලනඥයන්ට ඕන විදියට OIC ලා පත් කරපු SSP ලා පත් කරපු SENIOR DIG ලා පත් කරපු එහෙම පොලීසියක්. විමර්ශන වලට බලපෑම් කරපු අතදාපු පොලපීසියක්. මේක ස්වාධීන කරන්නේ කොහොමද කියලත් ඔහුට ලොකු වගකීමක් තියනවා. ඉන් එහා ගිහිල්ලා ඔබට හතක ඇති මීට මාස දෙකකට කලින් අපි කිව්වා ශ්‍රේෂ්ඨාධිකරණයේ වද හිංසා නඩුවකට අදාළව දුන්න තීන්දුවක්. යසන්ත කෝදාගොඩ විනිසුරුතුමා දුන්නා පොලීසියේ දිනෙන් දිනම මේ ටෝච සම්බන්ධ සිදුවීම් වාර්තා වීම ගැන. ඒකේදි කියනවා මේ ටෝච වගේ දේවල් නවත්තන්න පොලීසියේ ප්‍රධානීන්ට වගේම ඇමතිවරයාට සහ අමාත්‍යාංශ ලේකමටත් වගකීමක් තියනවා ඉදිරියේදී ප්‍රධානීන්ට විරුද්ධව දිගට දිගටම මෙය වාර්තා වුවහොත් ප්‍රධානීන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්න වෙනවා වගේ එකක් තිබ්බා. එතකොට ඒ වෙනකොට වියානි ගුණතිලකලා හිටියට අමාත්‍යාංශ ලේකම් විදිහට දැන් ඉන්නේ රවී සෙනෙවිරත්න. එතකොට මේ ටෝච නවත්තනූ එක වංචා දූෂණ නවත්තන එක තාඹුගලගේ ප්‍රකාශයේ අපි දැක්කා ඊට පස්සේ මේ හැම දෙයක්ම එතකොට දැන් තියෙන්නේ රවී සෙනෙවිරත්නට. පාස්කු වලට යුක්තිය ඉෂ්ට කරන්න මූලික පියවර ගන්න එක මේ හැමදෙයක්ම. එතකොට මේ අමාත්‍යාංශය භාරව කලින් හිටියේ ටිරාන් අලස් ටිරාන් අලස්ගේ පොලිසිය සම්බන්ධයෙන් ක්‍රියාකාරීත්වය දැඩි විවේචනයට ලක්වුනා. ටිරාන් අලස් අත්අඩංගුවට ගතයුතු තත්වයට පත්වෙමින් තිබ්බා. ඊලගට වීසා අදාලව කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කිරීම ඒවා කලේ ටිරාන් අලස්. ඒ කැබිනට්පත් අස්කිරීම අදාලව දායක වුනේ අමාත්‍යාංශ ලේකම් ඒ කියන්නේ රවී සෙනෙවිරත්නට කලින් ඒ පුටුවේ හිටිපු වියානි ගුණතිලක. ඊට පස්සේ පාස්පෝට් ඉෂූ එකට අදාලවත් එහෙමයි. එතකොට මේ වීසා, පාස්පෝට් පොලිසියේ වෙච්ච දේවල් වලට අදාලව ටිරාන් අලස් ඇතුළු අයව අත්අඩංගුවට ගත යුතුයි. රවී සෙනෙවිරත්නට ඊට අවශ්‍ය හැකියාව තියෙනවා අවශ්‍ය නියෝග දෙන්න.

ලබා ගැනීමේදී පාස්කු ප්‍රහාරය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට වලක්වා ගැනීමට හැකියාව තිබූ.. මොකක්ද කැල්ල පේන් නෑ. ප්‍රකාශ කරමින් සාක්ෂි ලබා දී ඇත. එම ප්‍රකාශයේ පිටපතක් මේ සමග ඉදිරිපත් කරමි. 2019.04.09 වන දින ලද බුද්ධි තොරතුරු නිසි පරිදි විමර්ශනය නොකර 2019.04.19 වන දින පාස්කු ප්‍රහාරය සිදුකිරීමට ඉඩ හරිමින් දණ්ඩ නීති සංග්‍රහයේ 296 සමග කියවිය යුතු 102 යටතේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඇතුළු නිලධාරීන්ට විරුද්ධව විමර්ශනයක් සිදුකරන ලෙස ඔබ තුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි " කියලා ලියලා තියනවා. මෙකේ පිටපතක් එවලා තියෙනවා නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ පිටපත් CID එකට ලැබිලා තියෙන්නේ 2024 ජනවාරි මසේ 29 වෙනිදා. එතකොට මේ ඔබට මතක ඇති මේ MediaLK එකේ පැතිව මාධ්‍ය සාකාච්ඡාවේදීත් පාලිත සිරිවර්ධන මහතා එම චෝදනාව කලා. මේ ලියුම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතට ආවාට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පති රොහාන් ප්‍රේමරත්න 2014.07.01 වෙනිදා පොලිස්පතිට ලිපියක් යවනවා උක්ත කරුණ සම්බන්ධයෙන් විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති පාලිත සිරිවර්ධන මා වෙත පිටපතක් සහිතව ඔබ තුමා වෙත යොමු කරන ලද ලිපිය හා බැඳේ. ඒ අනුව ලිපියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කිරීම සඳහා ඔබතුමාගේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි. අනුමත කරමි. මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර වාර්තා කරන්න. පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්. 2024.07.02. ඔහු ඒක අනුමත කරලා නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත එවනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ඒක යවනවා මංගල දෙහිදෙණිය මහතාට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔහු ඊට පස්සේ ඒක විමර්ශනයට යවනවා. මේ විමර්ශනයේදී බොහෝ තොරතුරු අධ්‍යයනයට ලක් කරනවා. මේ කියපු ලිපි ලේඛන ලිපි යැවීමේ ලේඛන කටඋත්තර ගන්නවා එක එක්කෙනාගෙන්. මේ කටඋත්තර අරගෙන අවසානයේ එන නිගමනය මම කියන්නම්. අවසානයේ එන නිගමනය තමා මෙන්න මේ දවස්වල ඒ කියන්නේ මේ ලියුම ලියල තියෙන්නේ තියෙන්නේ මේ ලියුම එවලා තියෙන්නේ නිලන්ත ජයවර්ධන පොලිස්පතිට යවපු පිටපත තමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එවලා තියෙන්නේ. මෙක "අති රහස්‍යයි" කියලා තමයි එවලා තියෙන්නේ. එවලා මුද්‍රා සහිතව එවලා තියෙනවා. මෙක එවලා තියෙන්නේ මෙක මේ කවුද නිලන්ත ජයවර්ධනය එව්වට එවන්නේ අප්‍රේල් මාසේ නව වෙනිදා මේ විමර්ශනයේදී ඒ කියන්නේ මේ පාලිත සිරිවර්ධනගේ විමර්ශනයේදී අනාවරණය වෙලා තියනවා අප්‍රේල් මස 09 වෙනිදා ඉදන් අප්‍රේල් මස 13 වෙනිදා වෙනකම් රවී සෙනෙවිරත්න මහත්මයා ලංකාවේ ඉදලා නෑ. ඔහු විදේශගත වෙලා ඉදලා තියෙන්නේ. කෙනෙකුගේ නමට එවන ලිපියක් මෙහෙම "රහස්‍යයි" කියලා ගහන ලිපියක් වෙන අය විවෘත කරන්නේ නෑ. ඒක ඔහු ආවාට පස්සේ තමයි විවෘත කරන්නේ. මේ විමර්ශනයේදී කියනවා 2019.04.13 ඒ කියන්නේ රවී ලංකාවට ආපු දවස පරණ අවුරුද්ද නිවාඩු දවසක්. 2019.04.14 ඉරිදා අලුත් අවුරුද්ද නිවාඩු දවසක් 2019.04.15 සදුදා අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව විශේෂ නිවාඩුවක් ලබා දීලා තියෙනවා. ඒ අනුව රවී සෙනෙවිරත්න මහත්මයා ලංකාවට 2019.04.16 වෙනිදා. 04.16 වෙනිදා ලංකාවට ආවාට පස්සේ එයාට මේ ලියුම දෙනවා එයා මේ ලියුම බලනවා මේ ලියුම බලලා ඔහු ඒකට අදාල මිනිට් එකක් තියෙනවා ඔහුගේ PA මෙක වහාම විමර්ශන කරන්න කියලා. ඒකට ඔහු අත්සන් කරනවා රවී සෙනෙවිරත්න මහත්මයා. අත්සන් කරලා 16 වෙනිදාම ලියුම භාරදෙනවා. 16 වෙනිදා මේ ලියුම භාර දුන්නට පස්සේ ඇත්තටම එතකොට මෙක 22 දෙක තමා යවලා තියෙන්නේ. ඒකට හේතුව මේ ලියුම රවී සෙනෙවිරත්න ගිහිල්ලා භාර දෙන්නේ නෑ නියෝජ්‍ය පොලිස්පතිට හෝ ඊට පහල නිලධාරීන්ට රවී සෙනෙවිරත්න කරන්නේ ලියුම බලලා කියවලා මිනිට් එක තිබුණම අත්සන් කරනවා. අත්සන් කරලා ලියුම් ටික භාරදෙනවා. එහෙම භාර දුන්නට පස්සේ එතන ඉන්න නිලධාරින් තමයි ඊට පස්සේ එක භාරව ඉන්න කට්ටිය තමයි ඇත්තටම අදාල කටයුතු කරන්නේ. මෙකෙදි අනාවරණය වෙලා තියනවා රවී සෙනෙවිරත්නගේ වරදක් නැහැ ඔහු වෙලාවට ලියමු භාර දෙනවා. අනිත් එක මේ ලියුමේ ප්‍රහාරය එල්ල වීම පිලිබඳව දවසකුත් නැහැ. ඒ වෙනකොට ඇත්තටම රවී

ගෞරවයෙන් වාර්තා කරමින් ඉදිරි විමර්ශන කටයුතු සඳහා මෙම අසත්‍ය කරුණු ප්‍රකාශය තුළින් මෙම විමර්ශන කටයුතු සඳහා බලපෑමක් සිදුවන බව වාර්තා කරමින් මෙම මාධ්‍යවේදී තරිදු ජයවර්ධන යන අයට එරෙහිව ගරු අධිකරණයට සුදුසු නියෝගයක් නිකුත් කරන මෙන් ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින අතර මෙම හඬ පටය ඇතුළත් ඩී.වී.ඩී. පටය ඇතුළත් මුද්‍රා සහිත කවරය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ දේපල කුටිතාන්සිපත් අංක 86/24 යටතේ 2024.10.09 වන දින ඇතුළත් කිරීමෙන් අනතුරුව අද දින ගරු අධිකරණයේ අවධානය සඳහා ඉදිරිපත් කරන බව ගෞරවයෙන් වාර්තා කරමි.

15. ඉහත කරුණු ගරු අධිකරණයට ගෞරවයෙන් වාර්තා කරනු ලබන අතර මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන සිදුකර ප්‍රගතිය වාර්තා කිරීම සඳහා වෙනත් දිනයක් ලබාදෙන ලෙසට ගරු අධිකරණයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

2024.10.09

ස්ථානාධිපති,
මිනිමැරුම් විමර්ශන අංශය,
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

**ඩී. කේ. ඉන්දුක ද සිල්වා**
**ප්‍රධාන පොලිස් පරීක්ෂක**
**ස්ථානාධිපති**
**මිනිමැරුම් විමර්ශන අංශය**
**අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව**
**කොළඹ 01**